# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report

# 2013

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය**

**தேசியதிட்டமிடல் திணைக்களம - நிதிதிட்டமிடல் அமைச்சு**

Department of National Planning – Ministry of Finance and Planning

## ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව


| | | |
|---|---|---|
| 1. | දැක්ම, මෙහෙවර, කාර්යයන් සහ වගකීම් | 2 |
| 2. | දෙපාර්තමේන්තුවේ ඒකක සහ අංශ | 3 |
| 3. | ආංශික කාර්යය සාධනය | 4 |
| | 3.1 කෘෂිකර්ම, වාරිමාර්ග හා ඉඩම් | 4 |
| | 3.2 මහජන උපයෝගිතා | 7 |
| | 3.3 මාර්ග, වරාය, ප්‍රවාහන, තොරතුරු තාක්ෂණ, ජනමාධ්‍ය තැපැල් හා සන්නිවේදන | 11 |
| | 3.4 කර්මාන්ත, වෙළද, වෘත්තීය පුහුණු සහ වැවිලි | 15 |
| | 3.5 සංස්කෘතික, ආගමික, ජාතික ඒකාබද්ධතා, ක්‍රීඩා නිවාස සහ නාගරික සංවර්ධන | 17 |
| | 3.6 අධ්‍යාපන හා සෞඛ්‍ය | 18 |
| | 3.7 පරිසර, තාක්ෂණ හා පර්යේෂණ, ධීවර හා සංචාරක | 21 |
| | 3.8 සාර්ව ආර්ථික, සමාජ ආරක්ෂණ, ශ්‍රමික සහ බන්ධනාගාර | 25 |
| | 3.9 රාජ්‍ය කළමනාකරණය | 27 |
| 4. | සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය | 27 |
| 5. | මානව සම්පත් සංවර්ධනය සහ සාමාන්‍ය පරිපාලනය | 28 |
| 6. | මූල්‍ය කාර්ය සාධනය | 36 |

## 01. දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්

**දැක්ම**

ආසියාවේ ආශ්චර්ය කරා ශ්‍රී ලංකාව මෙහෙයවීම

**මෙහෙවර**

ඉහල මට්ටමේ ක්‍රමසම්පාදන වෘත්තිකත්වයක් පවත්වා ගැනීම හා ක්‍රමසම්පාදන නිපුනතා යාවත්කාලීනව අන්තර්ජාතික මට්ටමටගෙන ඒම හරහා සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් අනුගමනය කිරීම තුලින් රටේ සීමිත සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම.

**ප්‍රධාන කාර්යයන්**

I. මධ්‍ය හා දිගුකාලීන සංවර්ධන සැලසුම්, රාජ්‍ය අයෝජන වැඩ සටහන් සම්පාදනයකිරීම සහ ආංශික සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති සැකසීමසඳහා රේඛීය ආයතන වලට සහාය වීම.

II. සාර්ව ආර්ථික රාමුව සහ උපාය මාර්ග වැඩි දියුණු කිරීම.

III. ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති, අදාළ උපාය මාර්ග සහ වැඩසටහන් විමසුමට ලක් කිරීම සහ ව්‍යාපෘති ඇගයීම.

IV. වාර්ෂික ප්‍රාග්ධන අයවැය සැකසීම සඳහා තාක්ෂණික සහාය සැපයීම.

V. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති පිළිබද මූලික විස්තර ඉදිරිපත් කිරීම.

VI. ව්‍යාපෘති සැලසුම්කරණය හා ප්‍රතිපත්ති සම්පාදනයට අදාළව දෙපාර්තමේන්තුව වෙත පවරණු ලබන විශේෂ පැවරුම් ක්‍රියාත්මක කිරීම.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් "මහින්ද චින්තන සංවර්ධන සැලැස්මේ" මධ්‍ය-කාලීන සමාලෝචනයක් ලෙස, "2014 - 2016 සඳහා මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන උපාය මාර්ගික සැලසුම" සම්පාදනය කරන ලදී.

## 02. දෙපාර්තමේන්තුවේ ඒකක හා අංශ

දෙපාර්තමේන්තුවේ කාර්යභාර්ය කාර්යක්ෂමව ඉටුකරලීම පිණිස දෙපාර්තමේන්තුව අංශ 09 කට වෙන් කර ඇත. එම අංශ 09 තවදුරටත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ අංශ නියෝජනය වන පරිදි උප අංශ 31 කට වෙන් කර ඇත.එක් එක් අංශ ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුමගින් සිදු කරනු ලබන ඒ ඒ අංශයේ ප්‍රතිපත්ති සැලසුම් නිර්මාණය හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ල කෙරෙහි වගකීම දරණු ලබයි.

<u>**දෙපාර්තමේන්තුවේ අංශ**</u>

(i) කෘෂිකර්ම වාරිමාර්ග හා ඉඩම්

(ii) මහජන උපයෝගිතා

(iii) මාර්ග, වරාය, ප්‍රවාහන, තොරතුරු තාක්ෂණ, මාධ්‍ය, තැපැල් සහ සන්නිවේදන

(iv) කර්මාන්ත, වෙළඳ, වෘත්තීය, පුහුණු සහ වැවිලි

(v) සංස්කෘතික, ආගමික, ජාතික ඒකාබද්ධතා, ක්‍රීඩා, නිවාස සහ නාගරික සංවර්ධන

(vi) අධ්‍යාපන හා සෞඛ්‍ය

(vii) පරිසර, තාක්ෂණ සහ පර්යේෂණ, ධීවර, සංචාරක හා ආපදා කළමනාකරණ

(viii) සාර්ව ආර්ථික, සමාජ ආරක්ෂණ, ශ්‍රමික, බන්ධනාගාර සහ ප්‍රාදේශීය සංවර්ධන

(ix) මහජන කළමනාකරණ

මීට අමතරව දෙපාර්තමේන්තුවේ කාර්යයන් පවත්වාගෙන යාම සඳහා පහත අංශ 3 ද ඇත.

1. සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය
2. පරිපාලන අංශය
3. මූල්‍ය අංශය

## 03. ආංශික කාර්ය සාධනය

### 3.1 **කෘෂිකර්ම, වාරිමාර්ග හා ඉඩම්**

**<u>කෘෂිකර්ම</u>**

රටේ ආර්ථිකයේ කොඳු නාරටිය බඳු කෘෂිකර්මාන්තය මුළු ජනගහනයෙන් සියයට 70 කට වඩා වැඩි පිරිසකට ජීවනෝපාය මාර්ගයන් සලසයි. 2013 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය සියයට 10.8 ක් වූ අතර, එම සුළු පසුබෑමකට හේතු වී ඇත්තේ කාර්මික හා සේවා අංශයන්හි වේගවත් වර්ධනයයි. පසුගිය වසර 6 තුළ කෘෂිකාර්මික අංශයේ වර්ධනයේ සාමාන්‍ය සියයට 4.8 කි. 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී සියයට 4.2 ක ආංශික වර්ධනයක් දක්වා ඇත.

2013 වර්ෂයේදී, රජය විසින් කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා දරන ලද වියදම රු. මිලියන 66,097 ක් වූ අතර ඉන් රු. මිලියන 52,296 ක් පොහොර සහනාධාරය වේ. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නියැලෙන ජනතාවට ගුණාත්මක හා වැඩිදියුණු සේවාවක් සපයමින් එම ක්ෂේත්‍රයේ වර්ධනය කිරීම සඳහා පොහොර සහනාධාරය ද ඇතුළත්ව රු. මිලියන 60,028 ක් 2013 වර්ෂයේදී ආයෝජනය කර ඇත.

**විශේෂ වැඩසටහන්**

- දැයට කිරුළ - 2013 ප්‍රදර්ශනය සඳහා පත්‍රිකා සෑදීමට අවශය තොරතුරු ලබාදීම.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ - 2012 වාර්ෂික වාර්තාව සඳහා "කෘෂිකර්මාන්තය - ආහාර සුරක්ෂිතතාවය උදෙසා" සහ "කෘෂිකාර්මික ඵලදායීතාවය" යන විශේෂ සටහන් සැකසීම.

**<u>ව්‍යාපෘති ඇගයීම</u>**

ඇගයීම් සිදුකරන ලද ව්‍යාපෘති යෝජනා ලැයිස්තුව පහත පරිදි වේ.

| | ව්‍යාපෘතිය | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි ) |
|---|---|---|
| 01 | වියළි කලාපීය ජීවනෝපාය සහායවීමේ හා හවුල්වීමේ වැඩසටහන - අදියර 2 | 2,500 |
| 02 | ශ්‍රී ලංකාවේ පළතුරුවල පසුඅස්වනු හානිය කළමනාකරණය කිරීම සහ අගය එකතු කිරීම | 91.04 |
| 03 | වර්තමාන කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය නිපුණතා සහිත වෘත්තිකයන් බිහිකිරීම සඳහා කෘෂිකාර්මික පාසැල් සංවර්ධනය | 350 |
| 04 | මල් වගාවේ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වන ආයෝජන සැලැස්ම | 300 |
| 05 | ආසියාව තුළ මෙහෙයුම් සිදුකරන ආහාර හා කෘෂිකර්මාන්තය සඳහා | ඇ.ඩො. 435,000 |

| | | |
|---|---|---|
| | වන අන්තර්ජාතික පැලෑටි ජානසම්පත් සංවිධානය ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වීම. | |
| 06 | ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණීය තොරතුරු සඳහා ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ තාක්ෂණික සහාය ලබා ගැනීම | ඇ.ඩො. 450,000 |
| 07 | මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල රටකජු වගාව | ඇ.ඩො. 750,000 |
| 08 | බීජවල සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමේ පරීක්ෂණාගාරයක් පිහිටුවීම මගින් ලෙඩරෝග වලින් තොර ගුණාත්මක බීජ නිෂ්පාදනය තහවුරු කරමින් ඵලදායීතාවය ඉහළ නැංවීම සහ පළිබෝධනාශක භාවිතය අවම කිරීම | 200 |
| 09 | බඩඉරිඟු වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා නව ප්‍රභේද හා තාක්ෂණය සංවර්ධනය කිරීම | 5.5 |
| 10 | නොදන්නා හේතුවක් නිසා හටගන්නා වකුගඩු රෝගය සඳහා වන හේතු හා එම තත්ත්වයන් අවම කර ගැනීම සඳහා පවතින මාර්ගයන් හඳුනා ගැනීමට අදාළ ජාතික පර්යේෂණ වැඩසටහන | 755 |
| 11 | ගොවිපල යන්ත්‍රෝපකරණ ගෙවීමේ පදනම මත ගොවීන්ට භාවිතා කිරීම සඳහා ලබාදීමට මධ්‍යස්ථානයක් රජයේ සහය ඇතිව පිහිටුවීම | 15.1 |
| 12 | පැපොල්, දොඩම්, අන්නාසි සඳහා ලෙඩරෝග වලින් තොර රෝපණ ද්‍රව්‍ය නිපදවීම | 19 |
| 13 | අර්තාපල් ප්‍රභේද සංවර්ධනය හා අර්තාපල් බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය | 70 |
| 14 | දැනට පවතින කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අරමුණින් අගය දාමය හා වෙළඳපොල පාදක කරගත් කෘෂි ව්‍යාප්ති යාන්ත්‍රණයක් ඇතිකිරීම | 37.4 |

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශය මගින් අවසන් කරන ලද කාර්යයන්**

- ව්‍යාපෘති යෝජනා 14 ක් ඇගයීම සහ ඒ සඳහා වන නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හෝ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට යොමු කිරීම.
- කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 23 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගිවීම.

**<u>පශු සම්පත්</u>**

පශු සම්පත් අංශය ප්‍රධාන වශයෙන් කිරි ගව සහ කුකුළු ඌරන් සහ එළුවන් යන උප අංශ වලින් සමන්විතය. 2012 වසරේ මෙම අංශය සඳහා සමස්ත ආයෝජනය රු. මිලියන 2,428 ක් වූ අතර, එයින් රු. මිලියන 1,919 ක් මූලධන වියදම් ලෙස දේශීය ප්‍රභේද නංවාලීම, සත්ත්ව රෝග නිවාරණය, ව්‍යාප්ති සේවා පුළුල් කිරීම පශු සම්පත් ආශ්‍රිත පර්යේෂණ සහ ග්‍රාමීය ප්‍රජාව සංවර්ධනය සඳහා යොදවා ඇත. පශු සම්පත් අංශය සිදුකරනු ලබන සියලුම ක්‍රියාකාරකම් පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබන අතර ඒ සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ මිල්කෝ පුද්ගලික ආයතනය වැනි අනෙකුත් ආයතනවල සහයෝගීතාව ලැබේ.

**විශේෂ ක්‍රියාකාරකම්**

- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ″UnstoppableSri Lanka″රාජ්‍ය ආයෝජන ක්‍රමෝපාය සඳහා ″Da Industry towards Self Sufficiency - 2020″ පරිච්ඡේදය සැකසීම සඳහා දායක වීම.
- පශු සම්පත් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ ″කිරි ගවයන් ආනයනය කිරීම″ව්‍යාපෘතියේ කමිටු සාකච්ඡා සඳහා සහභාගී වීම.
- ව්‍යාපෘති වාර්තා 07 ක් විශ්ලේෂණය කර අදාළ නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 09 ක් සඳහා නිරීක්ෂණ ලබාදීම.

<u>වාරිමාර්ග හා ඉඩම්</u>

2013 වර්ෂයේ වාරිමාර්ග අංශය සඳහා රජයේ සමස්ත වියදම රු. බිලියන 34.8 ක් වූ අතර එම මුදලින් රු. බිලියන 31.2 ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කරන ලදි. ජල සම්පත් සංවර්ධනය යටතේ දැනටමත් මොරගහකන්ද සහ කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය, දැදුරුඔය ජලාශ ව්‍යාපෘතිය, උමාඔය ජල හැරවුම් ව්‍යාපෘතිය වැනි මහා පරිමාණ සංවර්ධන වැඩසටහන් ආරම්භ කොට ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අතරම නව ව්‍යාපෘති රැසක් මගින් කෘෂිකාර්මික හා වෙනත් ජල අවශ්‍යතාවයන් සඳහා ජලය සැපයීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරෙන අතර ඒ යටතේ ගිං/නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය, මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය, (මහවැලි බී කලාපය), මල්වතුඔය හැරවුම් ව්‍යාපෘතිය, වෙලිඔය සංවර්ධන ව්‍යාපෘති (මහවැලි එල් කලාපය) සහ උතුරුමැද පළාත් ඇල මාර්ග ව්‍යාපෘතිය සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇත.

ඉඩම් අංශය සඳහා 2013 වර්ෂයේ රාජ්‍ය ආයෝජනය රුපියල් මිලියන 4,806 ක් වන අතර ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 2,186 ක් වැය කොට ඇත. රාජ්‍ය ආයෝජන අතර ඉඩම් හිමිකම් ඔප්පු වැඩසටහන (බිම් සවිය) - රු. මිලියන 668, රාජ්‍ය කාර්යයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම - රු. මිලියන 1,252, උගත්පාඩම් හා ප්‍රතිසංවිධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම - රු.මිලියන 400 ඇතුළු අනෙකුත් සංවර්ධන වැඩසටහන් සඳහා රු. මිලියන 226 ක් ලෙස 2013 වර්ෂයේදී රාජ්‍ය ආයෝජන සිදුකොට ඇත.

**සිදුකරන ලද විශේෂ අධ්‍යයන**

2012 වර්ෂයේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ වාරිමාර්ග පරිච්ඡේදයේ “දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීම” යන සටහන සකස් කිරීම.

**විශේෂ වැඩසටහන**

රාජ්‍ය ආයෝජන ක්‍රමෝපාය 2014-2016 හි පස්වන පරිච්ඡේදයේ පිටු අංක 119-138 හි අන්තර්ගත "වාරිමාර්ග සහ ජල සම්පත් සංවර්ධනය" යන සටහන සකස් කර Unstoppable Sri Lanka 2020 තේමාව යටතේ මුද්‍රිත මාධ්‍යයෙන් සකස් කිරීම.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් අවසන් කරන ලද වාරි අංශයට අයත් කාර්යයන්**

1. වාරි හා ඉඩම් අංශයේ ව්‍යාපෘති වාර්තා පිළිවෙලින් 23 හා 04 ලෙස ඇගයීමට ලක් කොට, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ විදේශ සම්පත් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවලට ඉදිරි කටයුතු සඳහා යොමු කිරීම.
2. වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 17 කට අදාළ නිරීක්ෂණ සකස් කිරීම.
3. ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 8 කට අදාළ නිරීක්ෂණ සකස් කිරීම.
4. දේශගුණික විපර්යාස වලින් සිදුවන බලපෑම් අවම කිරීමේ වැඩසටහන යටතේ ගංගාද්‍රෝණි 08 ආයෝජන සැලසුම් සකස් කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීමට කටයුතු කිරීම.
5. වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කරන ව්‍යාපෘතියේ අදියර II සඳහා ආයෝජන වාර්තාව සකස් කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම.
6. මොරගහකන්ද සහ කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය, වේලි ආරක්ෂණ හා ජලසම්පත් සැලසුම් කරන ව්‍යාපෘතිය සහ ඉරණමඩු වාරි සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගති සමාලෝචන හා මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සක්‍රීයව දායකවීම.

## 3.2 මහජන උපයෝගිතා

මහජන උපයෝගිතා අංශය යටතට ගැනෙන අමාත්‍යාංශ

1. ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය
2. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
3. ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය

**<u>ජලසම්පාදන</u>**

වසර 2020දී සියළු දෙනාට සුරක්ෂිත පානීය ජල පහසුකම් තහවුරු කිරීමත් එයින් 60% කට නල ජල පහසුකම් සැපයීමත් රජයේ මූලික අරමුණක් වේ. මෙහිදී ජනගහනය වැඩි නාගරීකරණය වූ හා නාගරීකරණය වෙමින් පවතින ප්‍රදේශ, කාර්මීකකරණය වූ ප්‍රදේශ සහ නිදන්ගත වකුගඩු රෝගය වැනි

ජලය ආශ්‍රිත රෝග පැතිර ඇති ප්‍රදේශ සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් නල ජල පහසුකම් සැලසීම රජයේ එක් මූලික උපායමාර්ගයකි.
ග්‍රාමීය ප්‍රදේශ සඳහා ජලය ලබාදීමේ අරමුණින් ප්‍රජා මූලික සංවිධාන මගින් පාලනය වන ප්‍රජාමූල ජලසම්පාදන යෝජනා ක්‍රම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දෙමින් එම ප්‍රජාමූල සංවිධාන නියාමනය කිරීම රජයේ අනෙකුත් උපායමාර්ගය වේ.

**විශේෂ ක්‍රියාකාරකම්**

- 2013වසර තුල ව්‍යාපෘති යෝජනා 11 ක් ඇගයීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශ 26 සඳහා ඍජු හා සහායක නිරික්ෂණ ලබා දීම.
- 2012 මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව සඳහා ක්ෂේත්‍රයට අදාල පරිච්ඡේදය සැකසීම.
- දැයට කිරුළ 2013 වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා ජල සම්පාදන කටයුතු සම්බන්ධ තොරතුරු සපයා දීම.
- "නොනවතින ශ්‍රී ලංකා 2020-රාජ්‍ය ආයෝජන ක්‍රමෝපාය" පොතෙහි ජල සම්පාදන අංශයට අදාල පරිච්ඡේදය සකස් කිරීම
- පහත සඳහන් රැස්වීම් සඳහා සහභාගී වීම
    - ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීම් .
    - ජලසම්පාදන හා සනීපාරක්ෂණ ක්ෂේත්‍රයේ ගැටළු සාකච්ඡා කිරීම සඳහා වූ රැස්වීම්.
    - ජලසම්පාදන ව්‍යාපෘතිවල ප්‍රගති සමාලෝචන රැස්වීම්.

**<u>විදුලිබල හා බලශක්ති</u>**

විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රයෙහි සංවර්ධන ප්‍රතිපත්තිය
තිරසාර, සාධාරණ සහ පිවිතුරු, අඩු පිරිවැයකින් යුත් විදුලිය සැපයීම මඟින් සමාජීය සංවර්ධනය ඇති කිරීම.

ආර්ථික සංවර්ධනය අභිමුවෙහි විදුලිය සඳහා ඇති ඉල්ලුම අතිශයෙන් වැඩි වී ඇත. වානිජමය වශයෙන් සැලකු විට බලශක්ති අවශ්‍යතාවය මුලික වශයෙන් සපුරා ගනු ලබන්නේ පෙට්‍රෝලියම් ආශ්‍රිත ඉන්ධන සහ විදුලිබලය මඟිනි. එබැවින් විදුලිබලය සහ පෙට්‍රොලියම් නිෂ්පාදන රටෙහි ආර්ථිකයට ඍජුව බලපානු ලැබේ.

**<u>විදුලිබලය</u>**

රටෙහි බලශක්ති සඳහා අවශ්‍යතාවය සියයට 8කට ආසන්න ප්‍රමාණයකින් වාර්ෂිකව ඉහළ යනු ලැබේ. එම ඉහළ යන බලශක්ති අවශ්‍යතාවය හමුවෙහි වර්ෂ 2016 වන විට මෙගාවොට් 3950 ක

ස්ථාපිත ධාරිතාවයක් ජාතික විදුලිබල පද්ධතියට එක්කල යුතු වේ. 2013 වර්ෂයෙහි රජය විසින් විදුලිබල ක්ෂේත්‍රයෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.බිලියන 26.01 වැය කොට ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2013 වර්ෂයෙහි විදුලිය සඳහා ප්‍රවේශය සියයට 95 ක් විය. එසේම විදුලි ස්ථාපිත ධාරිතාවය සහ ජනනය කරන ලද මුළු විදුලිය ප්‍රමාණය මෙගාවොට් 3655 සහ ගිගාවොට් පැය 11,960 කි.

<u>ඛනිජතෙල් අංශය</u>

| **අනුගාමී ඛනිජතෙල් කර්මාන්තය (ඛනිජතෙල් ආනයනය, පිරිපහදුව, බෙදාහැරීම)** | **උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය (ඛනිජතෙල් ගවේෂණ කටයුතු)** |
|---|---|
| <u>වර්තමාන තත්ත්වය</u><br><br>- වර්තමානයෙහි ඛනිජතෙල් සඳහා ඉල්ලුම දිනකට කිලෝ බැරල් 100ක් පමණ වන අතර පසුගිය වසර 15 තුල මේ සඳහා ඇති ඉල්ලුම සියයට 5කින් පමණ ඉහල යන ලදී.<br><br>- ශ්‍රී ලංකාවෙහි ඛනිජතෙල් අවශ්‍යතාවයෙන් සියයට 100 ක්ම ආනයනය කරනු ලබන අතර මින් සියයට 40 ක පමණ අවශ්‍යතාවයක් බොරතෙල් ආනයනය කොට පිරිපහදු කිරීම මඟින් සිදුකරනු ලැබේ. ඉතිරිය සෘජුව පිරිපහදු කරන ලද ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය මඟින් සපයා ගනු ලැබේ.<br><br>(2012 වර්ෂය තුළ බොරතෙල් සහ පිරිපහදු කරන ලද ඛනිජතෙල් ආනයනය මෙට්‍රික් ටොන් 1637 දහසක් සහ මෙට්‍රික් ටොන් 2748 දහසක් වේ) | <u>වර්තමාන තත්ත්වය</u><br><br>- 2008 වර්ෂයෙහිදී මන්නාරම් දෝනියෙහි ඛනිජතෙල් ගවේශණ කටයුතු ආරම්භ කරන ලද අතර මේ වනවිට, සැලකිය යුතු ප්‍රගතියක් දක්නට ලැබේ.<br><br>- මන්නාරම් දෝණියෙහි දත්ත ලබාගැනීම අවසන් කොට ඇත.<br><br>- කෙයාර්න් ලංකා පුද්ගලික සමාගම විසින් ඛනිජතෙල් ගවේෂණ කටයුතු ආරම්භ කොට ඇති අතර, ප්‍රථම ළිඳ කැනීම මඟින් ඉතා හොඳ තත්වයේ ස්වාභාවික වායු හමුවූ බවට සාක්ෂි ලැබී ඇත. |

**විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි දායකත්වය**

2013 වර්ෂයෙහි අනුමත කරන ලද ව්‍යාපෘති

| නම | ඇස්තමේන්තු ගත මුදල (රු.මිලියන) |
|---|---|
| සංකල්ප පත්‍රිකාව- දකුණු පළාතෙහි මෙගාවොට් 1200 ක ගල් අඟුරු බලාගාරය ඉදිකිරීම | 234,000 |
| ජාතික විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණය කිරීම | 3700 |
| පුන්ඩාල්ඔය සහ පුන්ඩල් ඔය ඇල්ල හැරවීම (ඉහළ කොත්මලේ ජල විදුලිබල ව්‍යාපෘතිය යටතේ) | 630 |
| වේයන්ගොඩ - කිරිඳිවෙළ - පාදුක්ක කි.වෝල්ට් 200 සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය | 684.2 |
| වේයන්ගොඩ - තුල්හිරිය - කි.වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැන් සංවර්ධන ව්‍යාපෘතිය | 1395.4 |
| කෙරවලපිටිය උපපොළ සංවර්ධන (කි.වෝල්ට් 132) | 1641.7 |
| 132/33kv බත්තරමුල්ල උපපොළ සංවර්ධනය | 1707.7 |
| කි.වෝල්ට් 132/33 බත්තරමුල්ල උපපොළ සංවර්ධනය | 1707.7 |
| කොලොන්නාව -පන්නිපිටිය කිලෝ වෝල්ට් 220 සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම | 499.9 |
| පොල්පිටිය - නවහබරණ කි.ලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 6355.7 |
| පන්නිපිටිය - රත්මලාන කි.වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැන් පද්ධතියෙහි ව්‍යාපෘතිය වර්ධනය | 394.1 |
| දෙහිවල - ගල්කිස්ස භූගත විදුලි බෙදාහැරීම් සංවර්ධනය ව්‍යාපෘතිය | 1256.4 |
| බත්තරමුල්ල ප්‍රදේශයෙහි කිලෝවෝල්ට් 11 ක විදුලි බෙදාහැරීම් සංවර්ධන ව්‍යාපෘතිය | 1000 |

**මීට අමතරව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි විදුලිබල හා බලශක්ති අංශය විසින් 2013 වර්ෂය තුල පහත කාර්යයන් ඉටුකරන ලදී.**

- කැබිනට් පත්‍රිකා 30 ප්‍රමාණයක් සඳහා ඍජු හා වක්‍ර නිරීක්ෂණ ලබාදෙන ලදී.
- සාම්ප්‍රාදායික නොවන පුනර්ජනනීය බලශක්ති සංවර්ධකයන්ගේ ගෙවීම් හා සම්බන්ධ වාර්තාවක් සකස් කරන ලදී.
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරන ලද "රාජ්‍ය ආයෝජන උපාය මාර්ගය 2014-2016" හි විදුලිබල හා බලශක්ති පරිච්ඡේදය සහ දියඹ මුහුදෙහි ඛණිජතෙල් ගවේශණ යන උපඡේදය සකස් කරන ලදී.
- විදුලිබල සහ ඛණිජතෙල් ක්ෂේත්‍ර 2හි සංකල්ප පත්‍රිකා සකස් කරන ලදී.

## 3.3 මාර්ග, වරාය, ප්‍රවාහන, තොරතුරු, තාක්ෂණ, මාධ්‍ය, තැපැල්, සහ සන්නිවේදන

**මාර්ග**

ශ්‍රී ලංකාවේ ගුණාත්මක මාර්ග යටිතල පහසුකම් දර්ශකය 2008/2009 වසර වල පැවති 63 වන ස්ථානයේ සිට 2012/2013 වන විට 48 වන ස්ථානය තෙක් වර්ධනය වී ඇත.
සංවර්ධනය වන ආර්ථික ක්‍රියාකාරකම් හමුවේ මහාමාර්ග ඔස්සේ සිදු කෙරෙන ප්‍රවාහන කටයුතු සඳහා ඉල්ලුම වර්ධනය වී ඇති අතර, මේ වන විට රටේ සමස්ථ රථවාහන ගමනාගමනයෙන් 95% ක් මෙහෙයවනු ලබන්නේ මාර්ග ජාලය හරහාය.

මාර්ග යටිතල පහසුකම් සංවර්ධනය ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීමට සේම තුලනාත්මක ප්‍රාදේශීය සංවර්ධනයක් සඳහාද දායක වේ.

2016 වන විට සමස්ත මහාමාර්ග ජාලයම "සර්ව කාලගුණික" මාර්ග වශයෙන් සංවර්ධනය කිරීමට ඉලක්කගත කර ඇති අතර, එහිදී සියයට සියයක්ම ග්‍රාමීය ප්‍රවේශ පහසුකම් සැපයීමත්, අන්තර් පලාත් සම්බන්ධ, කෙරෙමින් ඉදිවන අධිවේගී මාර්ග ඔස්සේ කාර්යක්ෂම මගී සහ භාණ්ඩ සංචලනය වීම කෙරෙහි පහසුකම් සැලසීමටත් අපේක්ෂිතය.

**2013 වසරේ සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්**

I. අදාළ අමාත්‍යාංශ වෙත විෂයානුකූල ක්‍රමෝපායයන් ක්‍රියාත්මක කරලීම සඳහා අවශ්‍ය තාක්ෂණික යෙදවුම් සැපයීම.
II. "ග්‍රාම කේන්ද්‍රීය - ඒකාබද්ධිත මාර්ග වැඩසටහනට" අදාළව සංකල්පමය ප්‍රවේශයක් නිර්මාණය කර, අදාළ ආයතන වල සහයෝගය සහිතව වැඩසටහන ආරම්භ කිරීම.
(i – Road ව්‍යාපෘතිය) – (මාර්ග දහස ව්‍යාපෘතිය)
III. "ග්‍රාමීය පාලම් දහසක්" යන මැයෙන් සංකල්පමය ප්‍රවේශයක් නිර්මාණය කර ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සහයෝගය සහිතව ක්‍රියාත්මක කරලීම.
IV. නොනවතින ශ්‍රී ලංකා 2020 - රාජ්‍ය ආයෝජන ක්‍රමෝපායයන් 2014-2016 ප්‍රකාශනය සඳහා මාර්ග සංවර්ධනයට අදාළ පරිච්ඡේදය නිර්මාණය කිරීම.
V. රේඛීය අමාත්‍යාංශ සහ අදාළ ආයතන විසින් සපයන ලද නව යෝජනා ඇතුළත් කර "ව්‍යාපෘති පෙළගැස්මක්" පිළියෙළ කිරීම.
VI. ග්‍රාමීය මාර්ග හා ජාතික මාර්ග පද්ධතියට අදාළව සංකල්ප පත්‍රිකා නිර්මාණය කිරීම.
VII. කැබිනට් පත්‍රිකා 52 ක් සඳහා නිරීක්ෂණ ලබාදීම.
VIII. ව්‍යාපෘති යෝජනා 18 ක් ඇගයීම් සිදු කිරීම

**වරාය**

ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රධානතම දායකයෙකු ලෙස වරාය අංශය හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ වරායන් මගින් අඩි 20 සම ඒකක මිලියන 5.6 ක ප්‍රමාණයක් වාර්ෂිකව මෙහෙයවමින් ආර්ථික කටයුතු ප්‍රසාරණය සඳහා කැපී පෙනෙන බලපෑමක් ඇති කරයි. වර්තමානයේ කොළඹ සහ හම්බන්තොට යන ජාත්‍යන්තර වරායන් දෙකක් සහ ගාල්ල,ඔළුවිල්, ත්‍රිකුණාමලය, කන්කසන්තුරේ සහ පේදුරුතුඩුව යන ප්‍රාදේශීය වරායන් ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරීව පවතින අතර මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ දෙවන අදියර සහ කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය හරහා රටේ ආර්ථිකයට වරාය
ක්ෂේත්‍රය වෙතින් ලබා දෙනු ලබන දායකත්වය කැපී පෙනෙන ලෙස තවදුරටත් වර්ධනය වනු නිසැකය.

**ප්‍රවාහන**

ශ්‍රී ලංකාවේ ප්‍රවාහන අවශ්‍යතා සඳහා සුරක්ෂිත, විශ්වාසවන්තසහසුව පහසු සේවාවක් සැපයීම සඳහා වැඩිදියුණු කරන ලද හා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් සැපයීම අරමුණු කරගෙන ඇත. නිරන්තරව වැඩිවන ගොඩබිම් ප්‍රවාහන අවශ්‍යතා මගින්, මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා ඇති පහසුකම්වල අවශ්‍යතාවය මතුකර ඇත. එම නිසා, ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා තිරසාර ලෙස ආයෝජනය කිරීම, ප්‍රවාහන සේවා සඳහා පහසු ප්‍රවේශයසහ නූතන පහසුකම් සහිතව අන්තර් මාධ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා ඉහළ ප්‍රමුඛතාව ලබා දී ඇත. ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව පොදු මගී ප්‍රවාහන පහසුකම් සංවර්ධනය කිරීම හරහා පෞද්ගලික ප්‍රවාහන මාධ්‍යයන් වෙතින් පොදු මගීප්‍රවාහන මාධ්‍යයන් වෙත මගීජනතාව ආකර්ෂණය කරගැනීම තුළින් තිරසාර පොදු මගී ප්‍රවාහන සේවාවක් ස්ථාපිත කිරීම ප්‍රවාහන ක්ෂේත්‍රයේ අරමුණයි.

**සිවිල් ගුවන්සේවා**

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයේ දීර්ඝ කාලීන ඉල්ලුම් ප්‍රවණතාවය සෑම විටම ධනාත්මක ස්වරූපයක් පෙන්නුම් කරන අතරඑය දළ දේශීය නිෂ්පාදිතයට අනුරූපව වර්ධනය වෙයි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ අභ්‍යන්තර ගුවන්තොටුපළ 13ක සිදුකළ සැලකිය යුතු මට්ටමේ සංවර්ධන කටයුතු සමඟම කලාපයේ ගුවන් කේන්ද්‍රස්ථානයක් බවට පත්වීමේ ශ්‍රී ලංකාවේ ඉලක්කය යථාර්තයක් බවට පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව විසින් පියවර රැසක් ගෙන ඇත. ගුවන් ගමනා ගමනයේ පවතින වර්ධනය සමඟ රටතුළ කාර්යක්ෂම ගුවන්ගමන් සේවාවක් ඇති කිරීම සඳහා අවස්ථාව සලසමින් ගුවන් යානා නඩත්තු කිරීම, අළුත්වැඩියා කිරීම, යානාවලට ඉන්ධන සහ ආහාරපාන සැපයීම යන ක්ෂේත්‍රයන් හා සම්බන්ධයෙන්ද ඉල්ලුමක් ඇතිවෙතැයි අපේක්ෂා කෙරේ. තවද, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලෙහි සිදුකිරීමට සැලසුම්කර ඇති සංවර්ධන කටයුතුහරහාදිනෙන් දිනඉහළ යන

ගුවන්ගමන් මගීන්ගේ සංඛ්‍යාවට සරිලන පරිද්දෙන් එම ගුවන්තොටුපළ පහසුකම් පුළුල් කිරීම තුළින් මගී අවශ්‍යතා සපුරාලීමට හැකියාව ලැබෙනු ඇත.

**විශේෂ ක්‍රියාකාරකම්**

- අදාළ අමාත්‍යාංශ මගින් යොමු කරන ලද නව ව්‍යාපෘති යෝජනා 03 ක් ඇගයීමට ලක්කර ඇත.
- ප්‍රවාහන, වරායහාගුවන්සේවාඅංශ සඳහා ව්‍යාපෘති නාමාවලිය (Project Pipeline) සකස් කිරීම.
- ප්‍රතිපත්ති සහ උපායමාර්ග සැකසීම සඳහා අදාළ අමාත්‍යාංශ වෙත සහාය ලබාදීම.
- 2014-2016 රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහාවරාය, ගුවන්සේවාහා ප්‍රවාහන යන පරිච්ඡේද සකස් කිරීම.
- ප්‍රමුඛතා අංශ පාදක කර ගනිමින් 2014-2016 කාල සහ ප්‍රතිඵල දර්ශක සකස් කිරීම.
- 2014-2016 කාලය සඳහා රාජ්‍ය ආයෝජන සැකැස්ම පිළියෙල කිරීම.
- වරාය හා මහාමාර්ග, සිවිල් ගුවන් සේවාහාප්‍රවාහනයන අමාත්‍යාංශ මගින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා නිරීක්ෂණ සැපයීම.
- වරාය හා මහාමාර්ග, සිවිල් ගුවන් සේවාහාප්‍රවාහනයන අමාත්‍යාංශ මගින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා18 කට නිරීක්ෂණ සපයා ඇත.
- 2013 වාර්ෂික වාර්තාව සඳහා වරාය හා සිවිල් ගුවන් සේවාඅංශවල උප පරිච්ඡේද සැකසීම.
- දැයට කිරුළ වැඩසටහන සඳහා අදාළ ආංශික ලේඛන සැකසීම.
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2012 ප්‍රගති වාර්තාව සඳහා වරාය, සිවිල් ගුවන් සේවා සහ ප්‍රවාහන අංශයන්හි පරිච්ඡේද සැකසීම.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාව සඳහා අවශ්‍ය සහාය ලබාදීම.
- ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීමේදී රේඛීය අමාත්‍යාංශ සඳහා තාක්ෂණික යෙදවුම් ලබාදීම.

**<u>තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන</u>**

තොරතුරු තාක්ෂණය, මාධ්‍ය, තැපැල් හා විදුලි සංදේශ යන අංශවලින් තොරතුරු හා සන්නිවේදන අංශය සමන්විත වේ. තොරතුරු තාක්ෂණ සම්බන්ධ සේවා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර බාහිරකරණ (ICT/BPO) සහ දැනුම් බාහිරකරණ (ICT/KPO) යන ආදායම් උපයන කර්මාන්ත තොරතුරු තාක්ෂණ අංශයට ඇතුළත්ය.

ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය දැනුම පාදක කරගත් සේවා අංශයක් ලෙස ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකිය. මෙම අංශය තුළ තොරතුරු හා සන්නිවේදන පහසුකම් ඉහළ නැංවීම, තොරතුරු හා සන්නිවේදන මාධ්‍ය වෙත ළඟාවීම පහසු කිරීම, ඉ-රාජ්‍ය සේවා ප්‍රවර්ධනය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට වැදගත්වන නීතිමය පසුබිම සැකසීම යන කරුණු කෙරෙහි රජය මූලික අවධානය යොමු කරන අතර පද්ධති වැඩිදියුණු කිරීමේ ජාත්‍යන්තර ප්‍රමිතීන්

සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගත් සේවා සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම තුළ පෞද්ගලික අංශය අතිශය වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි.

**විශේෂ ක්‍රියාකාරකම්**

- අදාළ අමාත්‍යාංශ මගින් යොමු කරන ලද නව ව්‍යාපෘති යෝජනා 13 ක් ඇගයීමට ලක්කර ඇත.
- තොරතුරු තාක්ෂණ අංශය සඳහා ව්‍යාපෘති නාමාවලිය (Project Pipeline) සකස් කිරීම.
- ප්‍රතිපත්ති සහ උපායමාර්ග සැකසීම සඳහා අදාළ අමාත්‍යාංශ වෙත සහාය ලබාදීම.
- 2013-2016 රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන පරිච්ඡේදය සකස් කිරීම.
- ප්‍රමුඛතා අංශ පාදක කර ගනිමින් 2014-2016 කාල සහ ප්‍රතිඵල දර්ශක සකස් කිරීම.
- විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ, තැපැල් හා ජනමාධ්‍ය අංශවල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 18 කට නිරීක්ෂණ සපයා ඇත.
- 2013 වාර්ෂික වාර්තාව සඳහා තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අංශයෙහි උප පරිච්ඡේදය සැකසීම.
- දැයට කිරුළ වැඩසටහන සඳහා අදාළ ආංශික ලේඛන සැකසීම.
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2013 ප්‍රගති වාර්තාව සඳහා තොරතුරු හා සන්නිවේදන පරිච්ඡේදය සැකසීම.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාව සඳහා අවශ්‍ය සහාය ලබාදීම.
- ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීමේදී රේඛීය අමාත්‍යාංශ සඳහා තාක්ෂණික යෙදවුම් ලබාදීම.
- තොරතුරු තාක්ෂණ අංශය සඳහා 2016-2020 රාජ්‍ය ආයෝජන සැලැස්ම සකස් කිරීම.

## 3.4 කර්මාන්ත, වෙළඳ සහ වැවිලි

<u>කර්මාන්ත හා වෙළඳ</u>

**කර්මාන්ත අංශය**

ඉහළ අගය එකතු කිරිමක් සහිත, විවිධාංගීකරණය වු සහ තාක්ෂණයයන් බලගැන් වු කාර්මික පදනමක් පැවතිම දියුණු වෙමින් පවතින ආර්ථිකයක අත්‍යවශ්‍ය කොටසක් වේ. එමනිසා කර්මාන්ත සංවර්ධනය සඳහා වූ රාජ්‍ය ප්‍රතිපත්තියද අපනයන මත පදනම් වූ, ඉතා ඉහළ අගය එකත් කිරීමක් සහිත, තාක්ෂණික වශයෙන් සන්නද්ධ වූ, විවධාංගීකරණයට ලක් වූණු කර්මාන්ත අංශයන් බිහි කිරීම කෙරෙහි ප්‍රමුක අවධානයක් යොමු කොට ඇත. එබැවින් කර්මාන්තය අංශය සඳහා වන ප්‍රතිපත්තිමය අරමුණු ළඟා කර ගැනීම උදෙසා කර්මාන්ත අංශය මෙහෙයවීමේ අරමුණු ඇතිව පසුගිය වසරේදී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවද පහත විස්තර කර ඇති කටයුතුවල නියැලෙන ලදී.

- කර්මාන්ත අංශය ආශ්‍රිත ව්‍යාපෘති වාර්තා 8ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කරන ලද අතර අරමුදල් මූලාශ්‍රය අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත ව්‍යාපෘති අනුමැතිය පිළිබඳ දැනුම් දෙන ලදී.
- කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය මගින් ලැබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ 5ට ද, සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය මගින් ලැබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ 4කටද නිරීක්ෂණය ඉදිරිපත් කරන ලදී.
- රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව සමඟ අනුකූල වන කාර්මික ක්‍රමෝපායන් සැකසීම උදෙසා අදාළ රේඛිය ආයතන සමඟ සාකච්ඡා පවත්නා ලදී.
- ශ්‍රී ලංකාව සඳහා වන අපනයන සංවර්ධන ක්‍රමෝපායන් සැකසීමට අදාළ මූලික පියවර ගන්නා ලදී.
- "නොනවතින ශ්‍රී ලංකාව - 2020" - රජයේ රාජ්‍ය අයෝජන ක්‍රමෝපාය 2020 හි පරිච්ඡේද 11.1 කර්මාන්ත අංශය සැකසීම සඳහා අවශ්‍ය යෙදවුම් සැපයීම.
- දැයට කිරුළ වැඩසටහන සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම.
- අදාළ රේඛීය ආයතන මඟින් සංවිධානය කරනු ලබන මෙහෙයුම් කමිටු සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගි වී කර්මාන්ත අංශයේ ප්‍රගතිය උදෙසා අවශ්‍ය තොරතුරු හා උපදෙස් ලබා දීම.

## වැවිලි

### වැවිලි කර්මාන්ත අංශය

තේ, රබර්, පොල් සහ අපනයන කෘෂි බෝග වලින් සමන්විත වන වැවිලි අංශයට රටේ ආර්ථිකයේ වැදගත් තැනක් හිමිවේ. එමගින් සියයට 2.5 දායකත්වයක් රටේ දළ ජාතික නිෂ්පාදනයට ලබාදෙන අතර මිලියන 1.5 කට පමණ සෘජු හා වක්‍ර රැකියා අවස්ථා ලබා දී ඇත. 2013 වර්ෂයේ වැවිලි-භෝග අපනයන අදායම රු.බිලියන 295 පමණ වන අතර ඒ සඳහා, තේ අංශයේ දායකත්වය 46% පමණ වේ. ශ්‍රී ලංකාව, ලෝක වෙළඳපල සඳහා වැවිලි භෝග සපයන ප්‍රධාන රටක් වන අතර "සිලෝන් ටී" සඳහා ජාත්‍යන්තර වෙළඳපල තුළ විශාල ඉල්ලුමක් පවතී. තවද ශ්‍රී ලංකා තේ, ලෝකයේ ඉහළම ගුණාත්මකභාවයෙන් යුතු තේ ලෙස සැලකේ. නිෂ්පාදන වල ගුණාත්මක බව ඉහළ නැංවීම, නිෂ්පාදනය ඉහළ දැමීම සහ අලෙවිකරණ පහසුකම් සංවර්ධනය හරහා දේශීය වැවිලි කර්මාන්ත ජාත්‍යන්තර වෙළඳපල තුළ තරඟකාරී කර්මාන්ත ලෙස සංවර්ධනය කිරීම රජයේ අරමුණ වේ. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය, සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය, වැවිලි අංශයේ සංවර්ධනය සඳහා වගකීම් දරණ රජයේ අමාත්‍යාංශ ලෙස කටයුතු කරනු ලබයි.

2013 වර්ෂය තුළ, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් වැවිලි කර්මාන්ත අංශයේ ව්‍යාපෘති යෝජනා 6 ක් සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී. තවද වැවිලි කර්මාන්ත අංශයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සඳහා ඉදිරිපත් වූ අමාත්‍ය මණ්ඩල සංදේශ 12 ක් සඳහා නිරීක්ෂණ යවා ඇත. දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති වලට අදාලව මෙහෙයුම් කමිටු රැස්වීම්, ප්‍රගති සමාලෝචන රැස්වීම්, අයවැය සාකච්ඡා සඳහා සහභාගීත්වය දැක්වීම සහ අවශ්‍ය දත්ත ඉදිරිපත් කිරීම ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය තුළ සිදුකර ඇත.

"මහින්ද චින්තන ඉදිරි දැක්ම" - රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සකස් කරන ලද "2014-2016 රාජ්‍ය ආයෝජන උපායමාර්ග" ප්‍රකාශනයේ 11.3 පරිච්ඡේදය "ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී වැවිලි කර්මාන්තයක් කරා" පරිච්ඡේදයජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ වැවිලි කර්මාන්ත අංශය විසින් සම්පාදනය කරන ලදී.

## 3.5 සංස්කෘතික, ආගමික, ජාතික ඒකාබද්ධතා, ක්‍රීඩා, නිවාස සහ නාගරික සංවර්ධන

**සංස්කෘතික, ආගමික, ජාතික ඒකාබද්ධතා සහ ක්‍රීඩා**

**සංස්කෘතික, ජාතික උරුමයන්, ජාතික භාෂා, ආගමික කටයුතු සහ ක්‍රීඩා**

මෙම අංශය, ක්‍රීඩා, සංස්කෘතික හා කලා කටයුතු, ජාතික උරුමයන්, බුද්ධශාසන හා ආගමික කටයුතු, ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා යන විෂයයන් ඇතුළත් වන අතර, රේඛීය අමාත්‍යාංශය පහක සහ ඒවාට අනුබද්ධිත දෙපාර්තමේන්තුවල ව්‍යාපෘති සම්බන්ධ කටයුතු මෙම අංශය මඟින් ආවරණය කෙරේ.

**විශේෂ ක්‍රියාකාරකම්**

- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 21 කට නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- ව්‍යාපෘති යෝජනා 17 ක් සම්බන්ධයෙන් නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුවසහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- "Unstoppable Sri Lanka" - රාජ්‍ය ආයෝජන ක්‍රමෝපාය සඳහා "Shared Values and Inclusive Development" සහ "A Healthy Nation" යන පරිච්ඡේද දෙක සැකසීමට දායක වීම.
- 2013 අයවැය සාකච්ඡා සඳහා දායකත්වය ලබා දීම.

**නිවාස හා නාගරික සංවර්ධනය**

නිවාස හා නාගරික සංවර්ධන ක්ෂේත්‍රයට අදාළව, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා , නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය , පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය, නැවත පදිංචි කිරීම් අමාත්‍යාංශය හා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වෙමින් කටයුතු සිදු කරනු ලැබේ.
2013 වසරේදී නිවාස සංවර්ධනය වෙනුවෙන් රු.බි. 8 ක පමණ පිරිවැයක් දරා ඇති අතර, ඊට අතිරේක වශයෙන් කොළඹ නගරයේ පැල්පත් වාසීන් සඳහා නිවාස 50,000 ක් ඉදි කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රථම අදියර යටතේ 2011-2013 කාල පරිච්ඡේදය සඳහා වන පිරිවැය රු.බි.32කි. ඒ යටතේ 2013 වසරේ දී නිවාස 500 ක සම්පූර්ණ වැඩ නිමවා අවසන් කර ඇත.මීට අමතරව, රු.මිලියන 235 ක වියදමින් වතු නිවාස 464 ක් ඉදිකර ඇත.
නාගරික සංවර්ධන විෂයය කෙරෙහි වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් සහිතව ක්‍රියාත්මක වීමේ අරමුණින්, ක්‍රමෝපායික නගර සංවර්ධන වැඩසටහන හඳුන්වා දෙනු ලැබුණි. 2013 වසරේ දී නගර සංවර්ධනය වෙනුවෙන් දරණ ලද ප්‍රාග්ධන වියදම රු.බි. 6.5 කට ආසන්නය.
මේ යටතේ, අගනුවර ඇතුළු ප්‍රධාන නගරයන්හි ගංවතුර පාලනය, හරිත උද්‍යාන හා මංතීරු ඉදි කිරීම, තෙත් බිම් සංරක්ෂණය, පැරණි හා වටිනා ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය හා නාගරික පොදු පරිශ්‍ර සංවර්ධනය යනාදී සංවර්ධන ව්‍යාපෘති ප්‍රමුඛ වන අතර, ද්විතීයික හා සුළු නගර ආශ්‍රිතව පොළ

සංවර්ධනය, බස් නැවතුම් පොළ හා වෙළඳසැල් පහසුකම් සැපයීම, අභ්‍යන්තර මාර්ග සංවර්ධනය හා පදිකයින් සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම හා සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය යන කාර්යයන් ප්‍රමුඛ වේ.

**විශේෂ ක්‍රියාකාරකම්**

- ව්‍යාපෘති යෝජනා 28 ක් ඇගයුමට ලක් කර ඉන් 27 ක් සඳහා අනුමැතිය ලබා දීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශ 41 ක් සඳහා නිරීක්ෂණ ලබා දීම
- රාජ්‍ය ආයෝජන ක්‍රමෝපායයන් 2014 ප්‍රකාශනය සඳහා ලේඛන පිළියෙළ කිරීම (පරිච්ඡේදය 12)
- 2013 දැයට කිරුළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නිවාස හා නාගරික සංවර්ධනය සම්බන්ධ තොරතුරු සපයා දීම.
- නිවාස හා නාගරික සංවර්ධනය සම්බන්ධයෙන් අනාගත සංවර්ධන ක්‍රමෝපායන් හා වැඩපිළිවෙළවල් ඇතුළත් කොට සංකල්ප පත්‍රිකා පිළියෙළ කිරීම.

## 3.6 අධ්‍යාපන හා සෞඛ්‍ය

<u>අධ්‍යාපන</u>

නිරන්තරයෙන් වෙනස්වන ගෝලීයකරණය වූ දැනුම පාදක කොටගත් ආර්ථිකයක අභියෝග ජය ගැනීමට අවශ්‍ය නිපුණතාවයන්ගෙන් අනාගත පරපුර පරිපූර්ණ කිරීම සඳහා වූ රජයේ දැක්ම ක්‍රියාත්මක කරමින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු 2013 වර්ෂයේදී අඛණ්ඩව ක්‍රියාත්මක කෙරුණි. දරුවන්ගේ විවිධ නිපුණතා හා හැකියාවන් වැඩිදියුණු කරන ගුණාත්මක සහ ළමා මිතුරු අධ්‍යාපනයක් නිර්මාණය කරමින් අධ්‍යාපන අංශයේ ප්‍රධාන පරිවර්තනයක් මේ හරහා සිදුකරන ලදි. මෙහිදී ප්‍රධානම මැදිහත්වීම් වනුයේ, අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සහ ප්‍රාදේශීය විෂමතා අවම කිරීම සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට පාසල් තුනක් බිහිවන පරිදි පිහිටුවන ලද, සියළු පහසුකම් සහිත ද්විතියික පාසල් 1,000 සහ ඒ හා ජාලගත පෝෂක ප්‍රාථමික විදුහල් 5,000 යි. මීට අමතරව විධිමත් අධ්‍යාපනය සහ නිපුණතා අධ්‍යාපනය අතර මනා සම්බන්ධතාවයක් ඇතිකිරීමේ වැදගත්කම සහ තරුණ පරපුර සඳහා නිපුණතා අධ්‍යාපන විෂයයන් මූලික අවධියේදීම හඳුන්වාදීම පිළිබඳව අවධානය යොමු කරමින් රජය විසින් අ. පො.ස. (උ.පෙළ) සඳහා තාක්ෂණික විෂයධාරාව හඳුන්වා දෙන ලදි. ඒ අනුව 2013 වර්ෂයේදී පාසල් 250 ක් සඳහා මෙම විෂයධාරාව හඳුන්වා දෙන ලද අතර සිසුන් 13,000 ක් පමණ අදාළ විෂයයන් තෝරා ගන්නා ලදි. මෙමගින් කලා විෂයධාරාව සඳහා පවතින සහභාගිත්වය අඩුකිරීමටත් අ. පො.ස. (උසස් පෙළ) විද්‍යා, ගණිත, වාණිජ සහ තාක්ෂණික විෂයධාරාවන් සඳහා සහභාගිත්වය ඉහළ නැංවීමටත්, ඒ හරහා ශ්‍රම වෙළඳපොලේ ඉල්ලුම සපුරාලීමටත් හැකිවනු ඇත.

**2013 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්**

- රේඛීය අමාත්‍යාංශ සඳහා අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායන් සැකසීම සඳහා අවශ්‍ය තාක්ෂණික යෙදවුම් ලබාදීම.
- අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන 2013-2017 පිළියෙල කිරීම සඳහා සහාය දැක්වීම.
- "UNSTOPPABLE SRI LANKA 2020" රාජ්‍ය ආයෝජන ක්‍රමෝපායයන් 2014-2016 හි අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන පරිච්ඡේදයන් පිළියෙල කිරීම.
- අධ්‍යාපන ක්ෂේත්‍රයේ 2014-2017 සඳහා රාජ්‍ය ආයෝජන වගුව පිළියෙල කිරීම
- වාර්ෂික වාර්තාව 2012 හි අධ්‍යාපන අංශයේ ප්‍රතිසංස්කරණ උප පරිච්ඡේදය පිළියෙල කිරීම.
- අධ්‍යාපන අංශයේ සංවර්ධන රාමුව සාරාංශගත කරමින් "දැයට කිරුළ" ප්‍රදර්ශනය සඳහා පත්‍රිකා සැකසීම.
- අමාත්‍යාංශයෙන් සහ අදාළ ආයතනයන්ගෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා ඇතුළත් කරමින් ඉදිරි ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.
- අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන යන අමාත්‍යාංශ වලින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 59 ක් සහ ප්‍රතිපත්ති සම්බන්ධ පත්‍රිකා සඳහා නිරීක්ෂණ සැපයීම.
- අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අංශයේ නව ව්‍යාපෘති සහ වැඩසටහන් 56 ක් ඇගයීම.
- මාණ්ඩලික රැස්වීම්, මෙහෙයුම් කමිටු රැස්වීම්, ප්‍රගති සමාලෝචන සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම් සහ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු රැස්වීම් ඇතුළු රැස්වීම් 40 ක් සඳහා සහභාගී වීම.
- විශ්වවිද්‍යාල නගර සංවර්ධන වැඩසටහන ආදී වැඩසටහන් නිර්මාණය කිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට සහාය දැක්වීම සහ එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පාර්ශවයන් සමග විශේෂ රැස්වීම් සංවිධානය කිරීම.

<u>සෞඛ්‍ය</u>

රජයේ දැක්මට අනුව රටේ ආර්ථිකයට ඵලදායී දායකත්වයක් ලබා දීම සඳහා සෞඛ්‍ය සම්පන්න හා ක්‍රියාශීලි ජාතියක් සිටීම ඉතා වැදගත්ය. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා තවදුරටත් ප්‍රමුඛතාවය දෙමින් විශාල රාජ්‍ය ආයෝජනයක් එම ක්ෂේත්‍රය වෙනුවෙන් යෙදවීමේ ප්‍රතිඵලයක් ලෙස මෙරට සෞඛ්‍ය දර්ශක, දියුණු වෙමින් පවතින රටවල් අතර හොඳම දර්ශක බවට පත් කිරීමට හැකියාව ලැබී තිබේ. 2013 වර්ෂයේදී ජාතික හා පළාත් සහා දේශීය වෛද්‍ය අංශයද ඇතුළත්ව, සෞඛ්‍ය සඳහා රජය විසින් සිදු කර ආයෝජනය රු.බිලියන 120 කි.මෙය 2007 වර්ෂයේ ආයෝජනය හා සැසඳීමේදී සියයට 52 ක කැපී පෙනෙන වර්ධනයකි. මෙසේ රාජ්‍ය ආයෝජන ඉහළ දැමීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2007 වසරේදී රු.3,054 ක් වූ ඒක පුද්ගල සෞඛ්‍ය වියදම, 2013 දී රු.5,683 දක්වා ඉහළ ගොස් ඇත. 2013 වසරේදී සෞඛ්‍ය සඳහා වෙන් කළ ප්‍රාග්ධන වියදම් ප්‍රධාන වශයෙන්

රෝහල් සංවර්ධනය හා ප්‍රතිසංස්කරණ කටයුතු හා රෝහල් සඳහා අවශ්‍ය කරන උපකරණ මිලදීගැනීම් සඳහා යොදවනු ලැබිණි.

**විශේෂ අධ්‍යනයන්**

"ජාතික පෝෂණ කවුන්සිලය" මඟින් සම්පාදනය කරන ලද "පෝෂණය පිළිබඳ බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම අධ්‍යනය කොට ඒ සඳහා සුදුසු සංශෝධන ඉදිරිපත් කරන ලදී.

**අනෙකුත් කාර්යයන්**

- ව්‍යාපෘති වාර්තා 19 ක් ඇගයීමට ලක් කළ අතර, ඒ සම්බන්ධ නිර්දේශ, ජාතිත අයවැය දෙපාර්තමේන්තුවට, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හා අදාළ රේඛිය ආයතන වලට ඉදිරිපත් කරන ලදී.
- සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 34 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
- Unstoppable Sri Lanka 2020 – Public Investment Strategy (2014-2016) ප්‍රකාශනය සඳහා "healthy nation" නමින් පරිච්ඡේදයක් සම්පාදනය කරනු ලැබිණි.
- පවත්නා සෞඛ්‍ය ක්‍රමවේදය අර්ථාන්විත වෙනසකට ලක් කිරීම සඳහා "පස් අවුරුදු ජාතික සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම "2013-2017" සකස් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය සහ සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා වට ගණනාවක් පවත්වන ලදී.
- සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය යන අමාත්‍යාංශ විසින් සංවිධානය කරන ලද, ප්‍රගති සමාලෝචන හා මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගි වන ලදී.

**නිපුණතා අධ්‍යාපන අංශය**

රටෙහි ඉහළ ආර්ථික සංවර්ධනයක් සඳහා ඉහළ නිපුණතාවයකින් යුක්ත ශ්‍රම බලකායකින් යුක්ත වීම අවශ්‍ය වේ. එබැවින්, වසර 2020 වන විට ජාතික වෘත්තිය සුදුසුකම් සහිත 175,000 ක්ද ඇතුළුව වසරකට කිසියම් හෝ නිපුණතාවයකින් යුක්ත තරුණ, තරුණියන් 250,000 ක් බිහිකිරීම රජයේ අරමුණ වේ.

ඒ සඳහා,

- ව්‍යාපෘති වාර්තා හයක් ඇගයීමක ලක්කර ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබේ. ඊට අදාළ නිරීක්ෂණ එකී ආයතන, විදෙස් සම්පත් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබේ.
- යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 13 ක් සඳහා නිරීක්ෂණ ලබා දී තිබේ.

- රජයේ උපාය මාර්ගික යෝජනා සැළසුම 2014-2016 වන “නොනවතින ශ්‍රී ලංකාව 2020” ප්‍රකාශනය අඩංගු පරිච්ඡේද 7.2 නිපුණතා අධ්‍යාපනය සඳහා අවශ්‍ය වන යෙදවුම් ලබා දී තිබේ.
- දැනට පවතින නිපුණතා අධ්‍යාපන පද්ධතියෙහි අර්ථවත් වෙනසක් ඇති කිරීම සඳහා 2014-2020 නිපුණතා අංශ සංවර්ධන සැළැස්ම සැකසීම සඳහා රටෙහි සංවර්ධන පාර්ශවකරුවන්, පුද්ගලික හා රාජ්‍ය අංශයේ නිපුණතා අංශයේ පුහුණුව සපයන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා වාර කිහිපයක් පැවැත්වීම
- 2014-2020 නිපුණතා අංශ සංවර්ධන සැළැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය සහයෝගය ලබා ගැනීමට ආසියානු සංවර්ධන බැංකුව, කොරියානු, ලෝක බැංකුව වැනි සංවර්ධන පාර්ශවකරුවන් සමඟ රැස්වීම් පැවැත්වීම.
- නිපුණතා අධ්‍යාපන අංශයේ යටතේ “දැයට කිරුළ” වැඩසටහන සඳහා අවශ්‍ය තොරතුරු ලබා දී තිබේ.

## 3.7 පරිසර, තාක්ෂණ සහ පර්යේෂණ, ධීවර, සංචාරක

**<u>පරිසර</u>**

සීඝ්‍ර ආර්ථික සංවර්ධනය හා දේශගුණ විපර්යාසයන් හේතුවෙන් පරිසරයට දැඩි බලපෑම් එල්ලවෙමින් පවතී. රජයේ පාරිසරික ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වන ඉදිරි පරම්පරාව සඳහා ස්වාභාවික උරුමය ලබාදීම, භූමිය, සත්ව හා ශාක ප්‍රජාව සමග සහයෝගයෙන් කටයුතු කළ හැකි තිරසාර සංවර්ධනයක් ඇති කිරීම සඳහා අදාල පාර්ශවකරුවන් විසින් විවිධ වැඩසටහන් 2013 වසරේදී ක්‍රියාත්මක කරන ලදී. සාකච්ඡා, රැස්වීම් හා වැඩමුළු වලට සක්‍රීයව දායක වෙමින් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලදී. 2013 වර්ෂය සඳහා ව්‍යාපෘති ඇගයීමේදී ප්‍රධාන පාරිසරික අභියෝගයන් වන දේශගුණ විපර්යාසයන්ට මුහුණදීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් වර්ධනය කිරිම, ජෛව විවිධත්වය සුරකීම හා වන ආවරණය වැඩිකිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී.

**<u>තාක්ෂණ හා පර්යේෂණ</u>**

තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රය ලෝක මට්ටමට ගෙන යාම රජයේ ප්‍රධාන අරමුණක් වේ. රටක ආර්ථික සංවර්ධනය කෙරෙහි ඉහළ තාක්ෂණික කර්මාන්ත ක්ෂේත්‍රය විශාල දායකත්වයක් දක්වනු ලබයි. ඉහළ තාක්ෂණික කර්මාන්ත ප්‍රවර්ධනය තුලින් දේශීය කර්මාන්තවල ගුණාත්මකභාවය, ඵලදායීතාවය හා තරඟකාරිත්වය වැඩි කිරීමට රජය විසින් දැනටමත් අවශ්‍ය පියවර ගෙන ඇත. පසුගිය වසර කිහිපයේදී සිදුකරන ලද නැනෝතාක්ෂණය, ජෛව තාක්ෂණය වැනි ක්ෂේත්‍රයන්හි පර්යේෂණ තුලින් ආහාර සැකසීම, පටක විද්‍යාව හා පොහොර යන අංශයන්හී ප්‍රවර්ධනයක් පෙන්වා ඇත.

**විශේෂ ක්‍රියාකාරකම්**

- අදාළ අමාත්‍යාංශ මගින් යොමු කරන ලද නව ව්‍යාපෘති යෝජනා 11 ක් ඇගයීමට ලක්කර ඇත.
- තාක්ෂණ හා පර්යේෂණ අංශය සඳහා ව්‍යාපෘති නාමාවලිය (Project Pipeline) සකස් කිරීම.
- ප්‍රතිපත්ති සහ උපායමාර්ග සැකසීම සඳහා අදාළ අමාත්‍යාංශ වෙත සහාය ලබාදීම.
- 2013-2016 රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා තාක්ෂණ හා පර්යේෂණ පරිච්ඡේදය සකස් කිරීම.
- ප්‍රමුඛතා අංශ පාදක කර ගනිමින් 2014-2016 කාල සහ ප්‍රතිඵල දර්ශක සකස් කිරීම.
- තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 3 කට නිරීක්ෂණ සපයා ඇත.
- 2013 වාර්ෂික වාර්තාව සඳහා තාක්ෂණ හා පර්යේෂණ අංශයෙහි උප පරිච්ඡේදය සැකසීම සඳහා තොරතුරු ලබා දීම.
- දැයට කිරුළ වැඩසටහන සඳහා අදාළ ආංශික ලේඛන සැකසීම.
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2013 ප්‍රගති වාර්තාව සඳහා තාක්ෂණ හා පර්යේෂ පරිච්ඡේදය සැකසීම.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාව සඳහා අවශ්‍ය සහාය ලබාදීම.
- ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීමේදී රේඛීය අමාත්‍යාංශ සඳහා තාක්ෂණික යෙදවුම් ලබාදීම.
- තොරතුරු තාක්ෂණ අංශය සඳහා 2016-2020 රාජ්‍ය ආයෝජන සැලැස්ම සකස් කිරීම.

**<u>ආපදා කළමනාකරණය</u>**

ආපදාවක් යනු නොසිතු මොහොතක සිදුවන අනතුරක් හෝ ස්වාභාවික විපතක් ලෙස සැලකෙන අතර එමගින් ජීවිත හා දේපළ වලට දැඩි බලපෑම් එල්ල වේ. අපරටෙහි සිදුවන ප්‍රධාන ස්වාභාවික ආපදාවන් ලෙස සැලකෙන්නේ ගංවතුර, නියඟ, නායයෑම්, අකුණු සැර හා දැඩි සුළං වේ. මිනිසාගේ මැදිහත්වීම, පාරිසරික හායනය, දේශගුණ විපර්යාසයන් හා සීඝ්‍ර ආර්ථික සංවර්ධනය හේතුවෙන් ස්වාභාවික ආපදාවන් සිදුවන වාරගණන වැඩි වෙමින් පවතී. ස්වාභාවික ආපදාවන් හේතුවෙන් වසරකට ආර්ථිකයට සිදුවන අලාභය එක්සත් ජනපද මිලියන 50-60ක් පමණ වේ යැයි ගණන් බලා ඇත. ඒ අනුව 2013 වසරේදී පශ්චාත් ආපදා කළමනාකරණයට වඩා ආපදාවන්ගෙන් ඉදිරියේදී ඇති විය හැකි තත්වයන්ට මුහුණදීම සඳහා වැඩපිළවෙළක් සකස් කිරීමට වැඩි අවධානයක් යොමු කරන ලදී.

**<u>වනජීවී සංරක්ෂණය</u>**

සමාජයීය සංවර්ධනය උදෙසා ඉඩම් වෙන්කිරීම සහ අලිවාසස්ථාන ආශ්‍රිතව ඉඩම් පරිහරණ රටාව වෙනස්වීම හේතුවෙන් අලිමිනිස් ගැටුම වර්ධනය වෙමින් පවතී. පසුගිය දශක කිහිපය තුල ජනතාවට හා දේපළ වලට මෙන්ම වන අලින්ටද හානි කරමින් අලිමිනිස් ගැටුම උග්‍ර පාරිසරික ගැටළුවක් බවට පත්වී ඇත. ඒ අනුව මධ්‍යකාලීන රාමුව තුල ක්‍රියාත්මක කිරීම සඳහා අලිමිනිස් ගැටුම අවම වන,

වනජීවින් සුරකින හා පාරිසරික සංචාරක කර්මාන්තය වර්ධනය කළ හැකි වැඩසටහනක් පිළියෙළ කිරීමට අවධානය යොමු කරන ලදී.

**විශේෂ වැඩසටහන්**

2013 වසරේදී අනුමැතිය සඳහා ව්‍යාපෘති යෝජනා 46 ක් ලැබුණු අතර ඒ සඳහා වන නිරීක්ෂණ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් අදාළ ආයතන වලට යවන ලදී. දිස්ත්‍රික්ක වශයෙන් වන ආවරණය වැඩිකිරීම සඳහා සැලැස්මක් පිළියෙළ කිරිම, පිළිසරු හා ප්ලාස්ටික් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති වල කාලසීමාව දීර්ඝ කිරීම සහ ඒවා වඩාත් ඵලදායී හා කාර්යක්ෂමව සිදුකිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම සිදුකරන ලද අතර ලෝක බැංකුවේ සහයෝගයෙන් දේශගුණ විපර්යාසයන්ට අනුහුරුවීමේ ව්‍යාපෘතියක් සකස් කිරීමට අවශ්‍ය මූලික පියවරයන් ගනු ලැබීය.
ප්‍රධාන වශයෙන් ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් වන අමාත්‍ය මණ්ඩල සංදේශ 26කට පිළිතුරු සපයන ලදී.
ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව වැනි ආයතන සමග රැස්වීම් සංවිධනය කරනු ලැබූ අතර දේශීය පාර්ශව කරුවන් සමග සාකච්ඡා පවත්වන ලදී. පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ විසින් සංවිධානය කරන ලද වැඩමුළු 7කට සහ රැස්වීම 10කට සහභාගී වනු ලැබිණි.
2012 මුදල් අමාත්‍යාංශ වාර්ෂික වාර්තාව පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දෙනු ලැබීය.
2014-2016 රාජ්‍ය ආයෝජන සැලැස්ම පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දෙනු ලැබීය.

__ධීවර__

ධීවර අංශය සඳහා 2013 වසරේ සමස්ත රාජ්‍ය ආයෝජනය රු. මිලියන 2,268.3 ක් වන අතර එයින් රු. මිලියන 1,314.9 ක් මූලධන වියදම් වේ. මෙම අංශයෙහි සංවර්ධන විභවය හඳුනාගනිමින්, රාජ්‍ය ආයෝජන වැඩපිළිවෙල මගින් දිවයින පුරා ධීවර වරාය,නැංගුරමේපලවල් හා ගොඩබෑමේ ස්ථාන නංවාලීම, ගබඩා හා වෙළඳපල යටිතල පහසුකම් සපයාදීම, ධීවර බෝට්ටු සහ ආම්පන්න සැපයීම, වෙරළබඩ මුහුදු තීරවල හා ගැඹුරු මුහුදේ ජලජීවී වගාව සහ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා මූල්‍ය සහයෝගීතාව ලබාදීම මෙන්ම නිවාස සහ සමාජීය පහසුකම් නංවාලීමද සිදුකරනු ලබයි.

**විශේෂ ක්‍රියාකාරකම්**

- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ "Unstoppable Sri Lanka"රාජ්‍ය ආයෝජන ක්‍රමෝපාය සඳහා"Towards Modern Fisheries Industry" පරිච්ඡේදය සැකසීම සඳහා දායක වීම.
- ව්‍යාපෘති වාර්තා 8ක් විශ්ලේෂණය කර අදාළ නිරීක්ෂණයන් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට යොමු කිරීම.

- ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 5 ක් සඳහා නිරීක්ෂණ ලබාදීම.

__සංචාරක__

සංචාරක කර්මාන්තය දැනට ආර්ථිකයේ 6 වන විශාලතම විදේශ විනිමය උත්පාදන මාර්ගය වේ. 2013 වසරේ මෙම කර්මාන්තයේ සමස්ත විදේශ විනිමය උත්පාදනය එ.ජ.ඩොලර් බිලියන 1.715ක් විය.

2013 වසර අවසානය වන විට සංචාරක කාමර 16223 කින් සමන්විත විය. 2013 වසර තුළ සංචාරකයින් මිලියන 1.27ක් මෙරටට පැමිණි අතර එක් සංචාරකයකුගේ දිනක සාමාන්‍ය වියදම එ.ජ. ඩොලර් 157 ක් විය.

- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ප්‍රතිපත්ති සම්පාදනය හා අවශ්‍ය මඟපෙන්වීම් හරහා සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට දායක විය. සංචාරක අංශය සඳහා 2016-2020 රාජ්‍ය ආයෝජන සැලැස්ම සකස් කිරීම සිදු කෙරිනි.
- එමෙන්ම අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 2 කට නිරීක්ෂණ සපයා ඇත.

### 3.8 සාර්ව ආර්ථික, කම්කරු සබඳතා, සමාජ ආරක්ෂණ, බන්ධනාගාර සහ ප්‍රාදේශීය සංවර්ධන

__සාර්ව ආර්ථික හා කම්කරු සබඳතා__

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම, පවත්නා සාර්ව ආර්ථික ප්‍රශ්න හා ගැටළු හඳුනා ගැනීම, සමාලෝචනය හා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සාර්ව ආර්ථික සැලසුම් හා කම්කරු සබඳතා අංශයේ වගකීම වේ. මෙම අංශය මගින් දළ ජාතික නිෂ්පාදනය, උද්ධමනය හා ගෙවුම් ශේෂය ආදි සාර්ව ආර්ථික විචල්‍යයන් හා බැඳුණු කරුණු සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි. ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය යටතේ ශ්‍රී ලංකාවේ සැලසුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා යෙදවුම් - නිමැයුම් වගු සහ ඡායා මිල සැකසීම සඳහා වූ රැස්වීම් සම්බන්ධිකරණය කිරීමද මෙම අංශය මගින් සිදුකරනු ලබයි. කම්කරු අංශයේ කම්කරු සබඳතා, සේවා නියුක්තිය, විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභ සාධන කටයුතුවල සැලසුම් කටයුතු සඳහා දායක වෙයි.

**විශේෂ ක්‍රියාකාරකම්**

- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 06කට හා ව්‍යාපෘති යෝජනා 06 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.
- මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ අදාළ අංශයන් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සපයන ලදි.
- දැයට කිරුළ 2014 යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා ආයෝජන සැලැස්ම සකස් කිරීම.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන 2014-2016 (ආංශික සටහන්)
- මධ්‍යකාලීන ප්‍රාග්ධන අයවැය රාමුව 2014-2016 සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම.

- ප්‍රධාන සාර්ව ආර්ථික හා ආංශික ඉලක්ක 2014-2016 සැකසීම.
- ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය යටතේ ශ්‍රී ලංකාවේ සැලසුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා යෙදවුම් - නිමවුම් වගු සහ ඡායා මිල සැකසීම සඳහා වූ රැස්වීම් සම්බන්ධීකරණය කිරීම.
- ජාතික මානව සම්පත් ප්‍රතිපත්තිය සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම.
- සංවර්ධන සහයෝගිතා ආයතන සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

<u>**ග්‍රාමීය සංවර්ධනය**</u>

පසුගිය දශක තුල ක්‍රියාත්මක වූ ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයන්ගේ පැවති අසමානතා සහ දුර්වලතා අවම කරමින් වර්තමාන රජයේ සංවර්ධන ක්‍රියාවලිය මේ වනවිට පවුල,ගම, නගරය, සහ කලාප එකිනෙකයා කරමින් එම කලාප මූලික ආර්ථිකය සහ ජාත්‍යන්තරයසමග සම්බන්ධ කරමින් ඒකාබද්ධ ග්‍රාමීය ප්‍රවේශයක් සඳහා යොමු වී ඇත. දේශීය සම්පත් විභවයන් යොදාගනිමින් කලාපීය සංවර්ධන ක්‍රියාදාමය සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම නව ග්‍රාමීය සංවර්ධන දර්ශනය වේ. මෙම රාමුව තුල, දේශීය සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගනිමින් විවිධ සංවර්ධන ප්‍රවේශයන් අතර මනා සංයෝජනයක් ඇතිකරමින් සංවර්ධනය ඉදිරියට ගෙනයාම සඳහා රජයේ නොපසුබටදායකත්වය ලබාදී ඇත.

එබැවින් රජයේ සංවර්ධන සැලැස්ම තුල සියලුම කලාප එකම සංවර්ධන තලයකට ගෙන එමින් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්වය ඉහල නැංවීමටත්, කලාප අතර අන්තර් සබඳතාවය ඉහල නැංවීමටත්, කලාප අතර පවතින අසමානතා අවම කිරීමටත්, එම කලාප ජාතික ආර්ථිකය හා ඒකාබද්ධ කිරීමටත් ප්‍රමුඛතාවය හිමි වී ඇත.

**විශේෂ කාර්යයන්**

- "2013 දැයට කිරුළ" ප්‍රදර්ශනය අරමුණු කරගනිමින් ඒ සඳහා අත් පොත සකස් කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය සහ තොරතුරු සම්පාදනය කිරීම.
- කුරුණෑගල, කෑගල්ල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වල පවතී "2014 දැයට කිරුළ " ප්‍රදර්ශනය සඳහා දිස්ත්‍රික් සැලසුම් සකස් කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය සහ තොරතුරු සම්පාදනය කිරීම .

- දිස්ත්‍රික් ලේකම්වරු සහ දිස්ත්‍රික් සැලසුම් අධ්‍යක්ෂකවරුන් සම්බන්ධීකරණය කරමින් සංවර්ධන ගැටළු නිරාකරණය කිරීමට සහ දිස්ත්‍රික් සංවර්ධන සැලසුම් පිළියෙළ කිරීමට කටයුතු සැලසීම.
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරන ලද එක් කැබිනට් පත්‍රිකාවක් සඳහා නිරීක්ෂණ සැපයීම සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා 07ක් ඇගයීම.
- පුරනැගුම වැඩසටහනේ කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම.
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශනයට පත්කරන ලද "unstoppable Sri Lanka-2020 " ග්‍රන්ථයේ "Empowering Village" පරිච්ඡේදය සකස් කිරීම.

## 3.9 . රාජ්‍ය කළමනාකරණය

කාර්යක්ෂම හා ඵලදායි රාජ්‍ය සේවයක් සඳහා රාජ්‍ය සේවය තුළ ක්‍රමික වර්ධනයක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ. පෞද්ගලික අංශය සංවර්ධන කාර්යයේ යෙදවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම තුලින් රාජ්‍ය අංශය කැපී පෙනෙන කාර්ය භාරයක් ඉටුකරනු ලබයි. මේ නිසා ඵලදායි හා කාර්යක්ෂම රාජ්‍ය සේවායක් සඳහා රාජ්‍ය අංශයේ මානව හා ප්‍රාග්ධන යන දෙකෙහිම ධාරිතා වර්ධනය සඳහා වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්ති යොමුවී ඇත. පසුගිය වසර තුළ රාජ්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව පහත සඳහන් පරිදි දායක වී ඇත.

- ව්‍යාපෘති යෝජනා 27 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇති අතර නිර්දේශ කිරිමේ ලිපි විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යවන ලදී.
- රාජ්‍ය කළමනාකරණ අංශයට අයිති විවිධ අමාත්‍යාංශ වලින් ලැබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ 27 ක් සඳහා නිරික්ෂණ ලබා දෙන ලදි.
- අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් මෙහෙය වන ලද මෙහෙයුම් කමිටු රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්විම් සඳහා එම ආයතන වල වර්ධනය සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම.
- රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව තුළ අදාළ අමාත්‍යාංශ වල කාර්ය සාධන නැංවීම සඳහා රැස්වීම් පැවැත්වීම.
- විදේශ ආධාර අරමුදල් මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති සඳහා ආරම්භක රැස්විම් පැවැත්වීම.
- දැයට කිරුළ සංවර්ධන වැඩසටහන සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම.

## 4. සංවර්ධන තොරතුරුමධ්‍යස්ථානය

<u>පුස්තකාල සංවිධානය</u>

- පිටතින් ලැබෙන සියළුම පොත්පත්, ලිපිලේඛන පුස්තකාලයට අත්කර ගැනීම සහ පරිශීලනයට පහසුවන ලෙස වර්ග කිරීම.
- සඟරා අංශය වැඩිදියුණු කිරීම.
- පුස්තකාලය භාවිතා කරන අයගේ පහසුව සඳහා ලිපිලේඛන ක්‍රමවත්ව සැකසීම.
- පොත් එකතුව නැවත ක්‍රමානුකූලව සැකසීම.

**<u>බොදාහැරීම්, විමසීම් සහ විමර්ශන සේවා</u>**

- තොරතුරු අවශ්‍යතා විමසීම් ගැන කටයුතු කිරීම.
- පරිගණක දත්ත පදනම් උපයෝගී කරගෙන තොරතුරු ගවේශන සැකසීම.
- තොරතුරු ප්‍රවර්ධනය සඳහා පරිගණක භාවිතා කොට බෙදා හැරීමට කටයුතු කිරීම.
- පුස්තකාලය භාවිතා කරන අයගේ අවශ්‍යතා අනුව පුවත්පත් ලිපි සඟරා සුපරීක්ෂණය.

**<u>අනෙකුත් පුස්තකාල සමඟ සම්බන්ධීකරණය</u>**

- වාර සඟරා ඒකාබද්ධ සූචිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.
- සම්මත ක්‍රියාපටිපාටීන් අනුගමනය කරමින් ජාතික පුස්තකාලය සහ ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරන ලද පුස්තකාල ජාලයන්හි විවිධ කාර්යයන්ට දායකවීම.
- අන්තර් පුස්තකාල හුවමාරු ක්‍රමය පවත්වාගෙන යාම.

**<u>දේශීය තොරතුරු ජාලයන්ට සම්බන්ධවීම</u>**

- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය (www.intranet.mo.gor.lk.) සඳහා නව තොරතුරු සැපයීම.
- SLISTINET තොරතුරු ජාලයට සහ මහ බැංකුව විසින් සම්පාදනය කරන ලද ආර්ථික සහ බැංකු පුස්තකාල ජාලයේ ( E-BANK NET) කාර්යයන්ට දායකවීම.
- ලංකා ජාතික පුස්තකාල ජාලය සමඟ දිගටම සම්බන්ධතා පවත්වාගෙන යාම.

## 5. මානව සම්පත් සංවර්ධනය සහ සාමාන්‍ය පරිපාලනය

**<u>2013.12.31 දිනට කාර්ය මණ්ඩලය</u>**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | සී.විජේවර්ධන මිය | අධ්‍යක්ෂ ජනරාල් |
| 02 | එස්.එස්.මුදලිගේ මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 03 | එම්.ගංගාදරන් මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 04 | එස් .ඩී .රත්නායක මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 05 | කේ.ඩී.එස්.ආර්.පෙරේරා මයා | අධ්‍යක්ෂ |
| 06 | එන්.විජේවීර මයා | අධ්‍යක්ෂ (මුදල්) |
| 07 | එන්.යූ.එන්.මෙන්ඩිස් | අධ්‍යක්ෂ |
| 08 | යූ.එන්.මල්ලවාරච්චි මයා | අධ්‍යක්ෂ |
| 09 | සී.සේනානායක මිය | අධ්‍යක්ෂ |
| 10 | ටී.ඒ.ඩී.ඩී.ප්‍රේමරත්න මයා | අධ්‍යක්ෂ |
| 11 | ටී.එම්.ජේ.බණ්ඩාර මයා | අධ්‍යක්ෂ |
| 12 | එම්.එෆ්.මුබාරක් මයා | අධ්‍යක්ෂ |
| 13 | පී.එච්.චන්දිමා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 14 | ඩී.පී.නිහරේපොල මිය | සහකාර අධ්‍යක්ෂ |
| 15 | ආර්.කේ.එම්.එන්.පලිපාන මයා | සහකාර අධ්‍යක්ෂ |

| | | |
|---|---|---|
| 16 | පී.එම්.එස්.ජයතිලක මයා | සහකාර අධ්‍යක්ෂ |
| 17 | කේ.එන්.පී.ජයරත්න මයා | සහකාර අධ්‍යක්ෂ |
| 18 | ටී.එම්.ඩී.පී.තෙන්නකෝන් මයා | සහකාර අධ්‍යක්ෂ |
| 19 | ඩබ්.එල්.පී .ප්‍රනාන්දු මිය | සහකාර අධ්‍යක්ෂ |
| 20 | ආර්.කේ.එල් ජාගොඩ මිය | සහකාර අධ්‍යක්ෂ |
| 21 | ටී.වයි.එල්.මුණසිංහ මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 22 | ආර්.ඩී.ඒ.මෛත්‍රීරත්න මයා | සහකාර අධ්‍යක්ෂ |
| 23 | ජී.ආර්.සී.හේවාවසම් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 24 | එම්.ඒ.ජී.තුෂාරි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 25 | ඊ.එෟ.සී.ඩී.පීරිස් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 26 | අයි.ලංකාතිලක මිය | සහකාර අධ්‍යක්ෂ |
| 27 | ඩබ්.ඒ.ජේ.සී.වික්‍රමාරච්චි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 28 | ඩී.ඒ.මනෝරත්න මිය | සහකාර අධ්‍යක්ෂ |
| 29 | ඩබ්.ඒ.වල්පිට මිය | සහකාර අධ්‍යක්ෂ |
| 30 | ඩී.එච්.ආර්.ඩී.විජේවර්ධන මිය | සහකාර අධ්‍යක්ෂ |
| 31 | කේ.ජී.ආර්.ජී.ආර්.වික්‍රමවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 32 | එන්.ටී.අමරතුංග මිය | සහකාර අධ්‍යක්ෂ |
| 33 | ඩී.පී.එස්.එම්.දයාසේකර මයා | සහකාර අධ්‍යක්ෂ |
| 34 | කේ.බී.එස්.එස්.ප්‍රනාන්දු මයා | සහකාර අධ්‍යක්ෂ |
| 35 | වී.සී.විජේවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 36 | එල්.එච්.එම්.ආර්.බී.ලංසකාර මයා | සහකාර අධ්‍යක්ෂ |
| 37 | ආර්.ජී.පී.ද සිල්වා මයා | සහකාර අධ්‍යක්ෂ |
| 38 | යූ.ඒ.ඩබ්.එල්.සුමනසේකර මිය | සහකාර අධ්‍යක්ෂ |
| 39 | කේ.ඩී.සී.තාමරසී මිය | සහකාර අධ්‍යක්ෂ |
| 40 | ඩබ්.එම්.හංසනී මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 41 | එම්.ජී.පී.කේ්ටී.ගුණවර්ධන මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 42 | බී.ඒ.නිෂාධි ලක්ෂිලා මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 43 | එම්.ඒ.එස්.දබරේරා මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 44 | පී.ඒ.එන්.අබේසේකර මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 45 | ආර්.ඒ.ඩී.ලක්ෂ්මී මිය | පරිපාලන නිලධාරිනී |
| 46 | එච්.එම්.ආර්.ඒ.බණ්ඩාර මයා | සංවර්ධන නිලධාරි |
| 47 | එස්.ඩී.ඉලේපෙරුම ආරච්චිගේ මිය | සංවර්ධන නිලධාරි |
| 48 | ඊ.එම්.කේ.ජී.කේ.එම්.ඒකනායක මයා | සංවර්ධන නිලධාරි |
| 49 | එස්.ඩී.සී.ප්‍රියංකා මිය | සංවර්ධන නිලධාරි |
| 50 | එච්.එම්.සුධර්මා හේරත් මිය | සංවර්ධන නිලධාරි |
| 51 | එස්.ඒ.ජී.සී.ජයසේකර මිය | සංවර්ධන නිලධාරි |
| 52 | ඩබ්.එන්.ආර්.චන්දිමා ලාලනී මෙය | සංවර්ධන නිලධාරි |
| 53 | ඩබ්.ඩී.තුෂාර මයා | සංවර්ධන නිලධාරි |
| 54 | ජේ.එම්.ඒ.කේ.ජයසේකර මිය | සංවර්ධන නිලධාරි |
| 55 | ඒ.ආර්.චන්ද්‍රා පද්මිණී මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 56 | කේ.ජී.පී.දමයන්ති මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 57 | පී.කේ.කේ.ආර්.රාජකරුණා මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 58 | ජේ.ඒ.ඩී.සී.ජයකොඩි මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 59 | ඩබ්.ඩී.පී.පුනාන්දු මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 60 | එච්.ඩී.ජී.නිමල් මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 61 | ආර්.එම්.පද්මසීලී මෙය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 62 | ආර්.ඒ.ඩී.කේ.රාජපක්ෂ මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 63 | එම්.එස්.රණසිංහ මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 64 | කේ.එල්.ඩබ්තසී.එල්.ද සිල්වා මෙය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 65 | පී.එස්.ආර්.පීරිස් මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 66 | නිමල් රංජිත් හෙට්ටි ආරච්චි මයා | කා.සේ.සේ1. |
| 67 | එම්.ඩී.රසාංජන ප්‍රනාන්දු මයා | කා.සේ.සේ1. |
| 68 | යූ.උපුල් රත්නකුමාර මයා | කා.සේ.සේ1. |
| 69 | එම්.ඒ.එල්.නලින් මයා | කා.සේ.සේ1. |
| 70 | බී.ප්‍රියන්ත මයා | කා.සේ.සේ11. |

| | | |
|---|---|---|
| 71 | ඒ.එම්.ආර්.එස්.ඩී.කුමාර මයා | කා.සේ.සේ11. |
| 72 | ආර්.ඒ.පී .පුෂ්පකුමාර මයා | කා.සේ.සේ11. |
| 73 | ඩී.ඒ.එන්.චන්ද්‍රතිලක මයා | කා.සේ.සේ11. |
| 74 | ජී.එස්.රෝහණ මයා | කා.සේ.සේ11. |
| 75 | ඩබ්.එම්.ජිනදාස මයා | කා.සේ.සේ11. |
| 76 | එන්.එස්.යූ.කේ.සිල්වා මයා | කා.සේ.සේ11. |
| 77 | එම්.පී.ආර්.රත්නායක මයා | කා.සේ.සේ11. |
| 78 | එම්.චන්දන ප්‍රදීප් මයා | කා.සේ.සේ11. |
| 79 | පී.සමන් කුමාර පෙරේරා මයා | කා.සේ.සේ111. |
| 80 | කේ.කේ.සී.කරස්නාගල මයා | කා.සේ.සේ111. |
| 81 | එම්.ඒ.එස්.කේ.ජයවර්ධන මයා | රියදුරු1 |
| 82 | කේ.වී.ඩී.ඒ.පී.කරවිට මයා | රියදුරු1 |
| 83 | ඒ.විජේතුංග මයා | රියදුරු1 |
| 84 | ඩබ්.එම්.එන්.කරුණාතිලක මයා | රියදුරු ’ 11අ‘ |
| 85 | කේ.ජේ.කුමාරසිංහ මයා | රියදුරු’ 11අ‘ |
| 86 | ඩී.බී.දිසානායක මයා | රියදුරු’ 11අ‘ |
| 87 | පී.ඩී.ඩී.පුෂ්පකුමාර මයා | රියදුරු’ 11අ‘ |
| 88 | ඩී.එම්.ඩී.ශිරෝන් මයා | රියදුරු’ 11අ‘ |
| 89 | ජේ.ජී.යූ.විමලසිරි මයා | රියදුරු’ 11අ‘ |
| 90 | පී.එස්.ආනන්ද මයා | රියදුරු’ 11අ‘ |
| 91 | එස්.ජයසූරියර් මයා | රියදුරු’ 11අ‘ |
| 92 | ඩී.ජී.බැසිල් සමන්ත මයා | රියදුරු’ 11ආ‘ |
| 93 | ටී.රත්නසිරි මයා | රියදුරු’ 11ආ‘ |

**<u>2013 වර්ෂයේ නව පත්වීම්</u>**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | කේ.බී.එස්.එස්.ප්‍රනාන්දු මයා | සහකාර අධ්‍යක්ෂ |
| 02 | වී.සී.විජේවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 03 | එල්.එච්.එම්.ආර්.බී.ලංසකාර මයා | සහකාර අධ්‍යක්ෂ |
| 04 | ආර්.ජී.පී.ද සිල්වා මයා | සහකාර අධ්‍යක්ෂ |
| 05 | යූ.ඒ.ඩබ්.එල්.සුමනසේකර මිය | සහකාර අධ්‍යක්ෂ |
| 06 | කේ.ඩී.සී.තාමරසී මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 07 | ඩබ්.එම්.හංසනී මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 08 | එම්.ජී.පී.කේ.ටී.ගුණවර්ධන මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 09 | බී.ඒ.නිශාධි ලක්ෂිලා මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 10 | එම්.ඒ.එස්.දබරේරා මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 11 | පී.ඒ.එන්.අබේසේකර මිය | සහකාර අධ්‍යක්ෂ |
| 12 | ඩබ්.ඩී.තුෂාර මයා | සංවර්ධන නිලධාරි |
| 13 | ජේ.එම්.ඒ.කේ.ජයසේකර මෙය | සංවර්ධන නිලධාරි |

## 2013 වර්ෂයේ උසස්වීම්

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | චාන්දනී විජේවර්ධන මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 02 | එස්.එස්.මුදලිගේ මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 03 | ඩබ්.ඩී.එස්.ගුණසිංහ මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 04 | එම්.ගංගාදරන් මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |

## 2013 වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරින්

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | එච්.ජී.මාලනී මිය | අධ්‍යක්ෂ ජනරාල් |

## 2013 වර්ෂයේ ස්ථාන මාරුවී පැමිණි නිලධාරින්

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | ජේ.එම්.එස්.ඩී.රත්නායක මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 02 | එන්.යූ .එන් මෙන්ඩිස් මයා | අධ්‍යක්ෂ |
| 03 | යූ.එන්.මල්ලවාරච්චි මයා | අධ්‍යක්ෂ |
| 04 | ඩබ්.එන්.ආර්.චන්දිමා ලාලනී මෙය | සංවර්ධන නිලධාරී |
| 05 | කේ.ජී.පී.දමයන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර 1 |
| 06 | ජේ.ඒ.ඩී.සී.ජයකොඩි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර 11 |
| 07 | ජේ.ජී.උපුල් විමලසිරි මයා | රියදුරු 11අ |
| 08 | එස් .ජයසූරියර් මයා | රියදුරු 11අ |
| 09 | ඩී.ජී.බැසිල් සමන්ත මයා | රියදුරු 11ආ |
| 10 | පී.එල්.යූ.ලියනගේ මයා | රියදුරු 11අ |
| 11 | එච්.ඒ .නිමල් හෙට්ටි ආරච්චි මයා | කාර්යාල සේවක සේවය 1 |
| 12 | යූ .උපුල් රත්න කුමාර මයා | කාර්යාල සේවක සේවය 1 |
| 13 | එම් .චන්දන ප්‍රදීප් ප්‍රනාන්දු මයා | කාර්යාල සේවක සේවය 11 |

## 2013 වර්ෂයේ ස්ථාන මාරුවී ගිය නිලධාරින්

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | ඩබ්.ඩී .එස්.ගුණසිංහ මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 02 | කේ.ඩී.ඒ.මූණසිංය මෙය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 03 | ජේ.ඒ.එස්.රූපසිංහ මිය | අධ්‍යක්ෂ |
| 04 | ර්.ඒ.රත්නසීල මයා | අධ්‍යක්ෂ |
| 05 | එන්.එම්.ඒ.කේ.කේ.නවරත්න මිය | සහකාර අධ්‍යක්ෂ |
| 06 | ඒ.කවිතා මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 07 | කේ.ඒ.එච්.කේ.පෙරේරා මිය | සැලසුම් සහකාර |
| 08 | කේ.ඒ.ජී.දිල්රුක්ෂි මිය | සැලසුම් සහකාර |
| 09 | එස්.එම්.ඩී.ඩී.සමරකෝන් මිය | සැලසුම් සහකාර |
| 10 | අනුලා රාමනායක මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර 1 |
| 11 | ඒ.එස්.එම්.වී.ඒ.චන්ද්‍රානී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර 11 |
| 12 | ඩබ්.එන්.ප්‍රිය ජයසිංහ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර 11 |
| 13 | පී.යූ.මැදවත්තගේ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර 11 |
| 14 | ජේ.කේ.රෝහිණී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර 11 |
| 15 | එස්.ගුණදාස මයා | රියදුරු සේවය 11අ |
| 16 | කේ.එම්.කරුණාසේන මයා | රියදුරු 11අ |

| | | |
|---|---|---|
| 17 | පී.එල්.යූ.ලියනගේ මයා | රියදුරු 11අ |
| 18 | එම්.කේ.උපාලි නිශාන්ත මයා | රියදුරු 11අ |

<u>විදේශපුහුණු - 2012</u>

| No. | Name | Designation | Training Programme & Country | Duration |
|---|---|---|---|---|
| 1 | චාන්දනී විජේවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ ජනරාල් | නව දිල්ලියේ පැවත්වූ Asia Leadership Program on Sustainable Development and Climate Change, වැඩමුළුව | 2013 පෙබරවාරි 02 සිට 10 දක්වා |
| | | | දකුණු කොරියාවේ පැවැත්වූ Asia – Pacific Regional Policy Forum on Early Childhood Care and Education – ECCE–වැඩමුළුව | 2013 සැප්තැම්බර් 10 සිට 12 දක්වා |
| | | | නව දිල්ලියේ පැවැත් වූ Midterm Review of ADB's Strategy 2020 and Long – Term Strategic Vision for the Asian Development Fund – Country Consultations, වැඩමුළුව | 2013 ඔක්තෝම්බර් 21එක් දින වැඩමුළුව |
| | | | සිංගප්පූරුවේ පැවැත්වූ Training Programme on E- Governance and Change Management for Senior Staff of the IRD and MOFP වැඩමුළුව | 2013 දෙසැම්බර් 29 සිට නොවැම්බර් 03 දක්වා |
| 2 | සංජය මුදලිගේ මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | සිංගප්පූරුවේදී පැවැත් වූ FABM වැඩමුළුව | 2013 මාර්තු 16 සිට 26 දක්වා |
| | | | සිංගප්පූරුවේදී පැවැත් වූ Public Private Partnership in development of infrastructure Project Course from වැඩමුළුව | 2013 ඔක්තෝම්බර් 16 සිට 25දක්වා |
| | | | කොරියාවේ පැවැත්වූ 4th Asia public – Private Partnership Practitioner's Network (ANP) Heads of PPP Unite Forum වැඩ සටහන | 2013 දෙසැම්බර් 10 සිට 11 දක්වා |
| 3 | මලර්මදී ගංගාදරන් මහත්මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | සිංගප්පූරුවේදී පැවැත්වූ Strategic Management, LKY school of public policy,වැඩමුළුව | 2013 මාර්තු 16 සිට 26 දක්වා |
| | | | භූතානයේදී පැවැත්වූ 2nd South Asian National Women's Machineries Consultation Mission වැඩසටහන | 2013 අගෝස්තු 21 සිට 23 දක්වා |
| | | | චීනයේදී පැවැත්වූ Establishment of two joint working Groups on Trade and Economic cooperation between Sri Lanka and China වැඩසටහන | 2013 අගෝස්තු 26 දක්වා |

| | | | | |
|---|---|---|---|---|
| | | | සිගප්පූරුවේදී පැවැත්වූ Training Programme on e- Governance and Change Management for senior staff of the Inland Revenue Department and the Ministry of Finance and Planning Sri Lanka at the National University of Singapore – 6 වෙනි පාඨමාලාව | 2013 අගෝස්තු 4 සිට 08 දක්වා |
| 4 | ශිරන්ති රත්නායක මහත්මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | සිගප්පූරුවේදී පැවැත්වූ Executive Training Program for the Staff of Ministry of Finance and Planning in Economics and Public policy – Third course වැඩමුළුව<br><br>දකුණු කොරියාවේ දී පැවැත් වූ Knowledge Sharing Program -2013 Capacity Building Workshop වැඩ සටහන | 2013 ජුලි 01 සිට 05 දක්වා<br><br>2013 අගෝස්තු 12 සිට 17 දක්වා |
| 5 | කේ.ඩී.එස්.ආර් පෙරේරා මහතා | අධ්‍යක්ෂ | කොරියාවේ දී පැවැත්වූ Expert consultation on knowledge and Capacity needs for sustainable development in the post -Rio era වැඩසටහන<br><br>තායිලන්තයේ පැවැත්වූ 69th Session of the UN Economic & Social Commission of Asia Pacific (UNESCAP) වැඩ සටහන<br><br>ඉන්දියවේ බැන්ගලෝරයේදී පැවැත්වූ Low – Carbon Green Growth in Asia : Policies and practices වැඩ සටහන | 2013 මාර්තු 06 සිට 08 දක්වා<br><br>2013 අප්‍රේල් 25 සිට මැයි 01 දක්වා<br><br>2013 ඔක්තෝම්බර් 17 සිට 19 දක්වා |
| 6 | චන්ද්‍රිකා සේනානායක මිය | අධ්‍යක්ෂ | සිංගප්පූරුවේදී පැවැත්වූ Results Management for Public Sector Excellence : Public Private Partnership for Development Result වැඩමුළුව | 2013 අගෝස්තු 19 සිට 23 දක්වා |
| 7 | ටී.ජී.ඩී. ධම්මික ප්‍රේමරත්න මහතා | අධ්‍යක්ෂ | තායිලන්තයේ පැවැත්වූ Sixth Asian and Pacific Population Conference from වැඩමුවව | 2013 සැප්තතැම්බර් 16 සිට 20 දක්වා |
| 8 | ටී.එම්.ජේ බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ | ජිනීවාහිදී පැවැත්වූ Expert Group Meeting MDG Consistent Macroeconomic<br>Substantive Session of the Economic and Social Council සමුවව<br><br>නේපාලයේ කත්මන්ඩු නුවර පැවැත්වූ Modelling for Planning in South Asia වැඩමුළුව | 2013 ජුලි 01 සිට 15 දක්වා<br><br>2013 ඔක්තෝම්බර් 01 සිට 02 දක්වා |
| 9 | එම්.එෆ්.ඒ මුබාරක් මහතා | අධ්‍යක්ෂ | කොරියාවේදී පැවති Training Programme on Economic Development Strategy (Sri Lanka) | 2013 සැප්තැම්බර් 01 සිට 14 දක්වා |

| | | | | |
|---|---|---|---|---|
| | | | වැඩමුළුව<br><br>සිංගප්පූරුවේදී පැවැත්වූ Training Proogramme on e Governance and Change Management for Senior Staff of the inland Revenue Department and the Ministry of Finance and Planning Sri Lanka at the National university of Eight Course වැඩමුළුව | <br>2013 නොවැම්බර් 29 සිට දෙසැම්බර් 03 දක්වා |
| 10 | එන්.යූ නිෂාන් මෙන්ඩිස් මහතා | අධ්‍යක්ෂ | පිලිපීනයේ පැවැත්වූ Evaluating for Impact : Methods and Approaches Invitation to the IE Week වැඩසටහන | 2013 නොවැම්බර් 04 සිට 08 දක්වා |
| 11 | එන් විජේවීර මිය | අධ්‍යක්ෂ මුදල් | දකුණු කොරියාවේදී පැවැත්වූ Training Course on Regional Economic and Financial Monitoring වැඩසටහන | 2013 ඔක්තෝම්බර් 23 සිට සැප්තැම්බර් 11 දක්වා |
| 12 | ඩී.ජේ.සී දිලානි පීරිස් මිය | සහකාර අධ්‍යක්ෂ | චීනයේදී පැවැත්වූ Regional Seminar on Gender Equality in Secondary Education, TVET and Skills for Employment වැඩසටහන | 2013 සැප්තැම්බර් 11 සිට to 13 දක්වා |
| 13 | වරුණි අප්සරා වල්පිට මිය | සහකාර අධයක්ෂ | චීනයේදී පැවැත්වූ Seminar on macroeconomic Development for Developing Countries වැඩසටහන | 2013 අප්‍රේල් 02 සිට 22 දක්වා |
| 14 | ටී.වයි.එල් මුණසිංහ මිය | සහකාර අධයක්ෂ | චීනයේදී පැවැත්වූ Study Tour for the Government Agents, Deputy Chief Secretaries (Planning) and District Planning Directors වැඩසටහන<br><br>මැලේසියාවේදී පැවැත්වූ Course on Economic Planning and Management වැඩසටහන | දින 5<br><br>2013 ඔක්තෝම්බර් 12 සිට සැප්තැම්බර් 04 දක්වා |
| 15 | කේ.එම්.එන්.එන් පලිපාන මහතා | සහකාර අධ්‍යක්ෂ | චීනයේදී පැවැත්වූ Training Course on Regional Logistics System Optimization වැඩසටහන<br><br>සිංගප්පූරුවේදී පැවැත් වූ eGovernane: practice and Innovation වැඩසටහන | 2013 සැප්තැම්බර් 26 සිට 24 දක්වා<br><br>2013.නොවැනොවැම්බර් 29 සිට දෙසැම්බර් 03 දක්වා |
| 16 | ටී.එම්.ඩී.පී. තෙන්නකෝන් මහතා | සහකාර අධ්‍යක්ෂ | පිලිපීනයේ පැවැත්වූ 8th Asia Clean Energy Forum සමුළුව<br><br>ඕස්ට්‍රේලියාවේදී හදාරනු ලබන Scholarship Programme උපාධි පාඨමාලාව | 2013 ජුනි 25 සිට 28 දක්වා<br><br>2014 සිට 2014 දක්වා |
| 17 | කේ.එන්තපී ජයරත්න මහතා | සහකාර අධයක්ෂ | ජපානයේදී හදාරනු ලබන JDS Scholarship (Masters) උපාධි පාඨමාලාව | 2013 - 2015 |
| 18 | කේ.ජී.ආර්.ජී.පී වික්‍රමවර්ධන මහතා | සහකාර අධ්‍යක්ෂ | ජපානයේදී පැවැත්වෙන Disaster management training වැඩසටහන<br><br>චීනයේ පැවැත්වෙන Seminar on Biogas Industry Promotion and | 2013 ජුනි 24 සිට 29 දක්වා<br><br>2013 සැප්තැම්බර් 27 සිට |

| | | | | |
|---|---|---|---|---|
| | | | Management වැඩසටහන<br><br>ඉන්දියාවේදී පැවැත්වෙන Low – Carbon Green Growth in Asia : Policies and Practices වැඩමුළුව | අගෝස්තු 16 දක්වා<br><br>2013 ඔක්තෝම්බර් 17 සිට 19 දක්වා |
| 19 | ආර්.ඒ.ඩී මෛත්‍රිරත්න මහතා | සහකාර අධ්‍යක්ෂ | ජපානයේදී හදාරනු ලබන JDS Scholarship (Masters) උපාධි පාඨමාලාව | 2013 - 2015 |
| 20 | ඩබ්.ඒ.ජේ.සී වික්‍රමආරච්චි මිය | සහකාර අධ්‍යක්ෂ | දකුණු කොරියාවේදී පැවැත්වූ *SME Policy Dvelopment* වැඩමුළුව<br><br>චීනයේදී පැවැත්වූ *Development Assistance in Experience Exchange-* වැඩමුළුව<br><br>චීනයේදී පැවති *Seminar on ODA Experience Exchanges* වැඩසටහන | 2013 මාර්තු 31 සිට අප්‍රේල් 0 *6* දක්වා<br><br>2013 ඔක්තෝම්බර් *10* සිට *30* දක්වා<br><br>2013 ඔක්තෝම්බර් *10* සිට *30* දක්වා |
| | පී.එම්.එස් ජයතිලක මහතා | සහකාර අධයක්ෂ | චීනයේදී පැවැත්වූ Seminar on MDGs and Sustainable Poverty Reduction වැඩමුළුව | 2013 අප්‍රේල් 10 සිට 26 දක්වා |
| 21 | එම්.ඒ.ජී. තුෂාරි මිය | සහකාර අධයක්ෂ | කොරියාවේදී පැවැත්වූ Knowledge Sharing Programe - Interim Report Workshop වැඩමුළුව<br><br>ජපානයේදී පැවැත්වූ Planning of Agricultural policy වැඩසටහන | 2013 ජනවාරි 14 සිට 20<br><br>2013 අගෝස්තු 22 සිට සැප්තැම්බර් 21 දක්වා |
| 22 | ඩී.ඒ. අනුපමා මිය | සහකාර අධ්‍යක්ෂ | ජපානයේ JDS Scholarship (Masters) උපාධි පාඨමාලාව | 2013 – 2015 |
| 23 | ආර්.කේ.එල් ජාගොඩ මිය | සහකාර අධ්‍යක්ෂ | ඉන්දියාවේ පැවැත් වූ Regional Perspective of Developing and Developed Countries Cooperation for SMEs Competitiveness, Marketing and Partnership වැඩමුළුව | 2013 නොවැම්බර් 11 සිට 22 දක්වා |
| 24 | ඩී.ඒ. නිහරේපොල මිය | සහකාර අධ්‍යක්ෂ | තායිලන්තයේ පැවැත්වූ Participated in Regional Consultation on Post Development Agenda වැඩමුළුව | 2013 මාර්තු 19 සිට 21 දක්වා |
| 25 | ඩී.පී.එස්.එම්. දයාසේකර | සහකාර අධ්‍යක්ෂ | සිංගප්පූරුවේදී පැවැත්වූ Executive For Staff of Ministry of Finance & Planning - Public Finance වැඩමුළුව | 2013 ජුලි 29 සිට අගෝස්තු 04 දක්වා |
| 26 | එච්.ආර්.වී.පී. විජේසේකර | සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවැත්වූ Study Tour of Regional Development/China | 2013 ජනවාරි 08 සිට 14 දක්වා |
| 27 | ඉනෝකා ලංකාතිලක මිය | සහකාර අධ්‍යක්ෂ | Seminar Basic Experiences of china's Social and Economic Development වැඩසටහන | 2013 මැයි 15 සිට ජුනි 04 දක්වා |

## 6. මූල්‍ය කාර්ය සාධනය - 2013

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම්වල සඳහන් පරිදි වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන සහ මුළු වියදම ,පුනරාවර්තන සහ මූලධන වශයෙන් පහත පරිදි සාරාංශ කළ හැක.

| | 2012 | 2013 | **වෙනස් වීමේ ප්‍රතිශතය** |
|---|---|---|---|

| වැඩසටහනෙහි නම | | | | | (%) 2012 වර්ෂයේ සත්‍ය වියදම් මත |
|---|---|---|---|---|---|
| | මුළු ප්‍රතිපාදනය (රුපියල්) | මුළු වියදම (රුපියල්) | මුළු ප්‍රතිපාදන (රුපියල්) | මුළු වියදම (රුපියල්) | |
| පුනරාවර්තන | 55,920,500 | 54,717,891 | 63,662,000 | 61,672,281 | -12.71 |
| මූලධන | 123,023,500 | 122,084,857 | 99,075,000 | 95,685,647 | 21.62 |
| **එකතුව** | **178,944,000** | **176,802,748** | **162,737,000** | **157,357,928** | **10.99** |

ඉහත සඳහන් තොරතුරු අයවැය ඇස්තමේන්තු වල සඳහන් පරිදි උප ව්‍යාපෘති අනුව වර්ග කර පහත සඳහන් පරිදි ඉදිරිපත් කළ හැක.

| උප ව්‍යාපෘතිය | වැඩසටහනෙහි නම (රුපියල්) | 2012 | | 2013 | | වෙනස් වීමේ ප්‍රතිශතය ( %) 2012 වර්ෂයේ සත්‍ය වියදම් මත |
|---|---|---|---|---|---|---|
| | | මුළු ප්‍රතිපාදනය (රුපියල්) | මුළු වියදම (රුපියල්) | මුළු ප්‍රතිපාදනය (රුපියල) | මුළු වියදම (රුපියල්) | |
| | **පුනරාවර්තන** | **55,920,500** | **54,717,891** | **63,662,000** | **61,672,281** | **-12.71** |
| 0 | සාමාන්‍ය පරිපාලනය | 52,586,500 | 52,343,576 | 60,889,400 | 59,006,251 | -12.73 |
| 2 | ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික කවුන්සිලය | 3,334,000 | 2,374,315 | 2,772,600 | 2,666,030 | -12.29 |
| | **මූලධන** | **123,023,500** | **122,084,857** | **99,075,000** | **95,685,647** | **21.62** |
| 0 | සාමාන්‍ය පරිපාලනය | 2,120,000 | 1,886,554 | 7,210,000 | 6,854,642 | -263.34 |
| 2 | ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික කවුන්සිලය | 229,500 | 229,500 | 215,000 | 211,950 | 7.65 |
| 7 | නැගෙනහිර පළාතේ ජල සම්පාදන සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘති කළමනාකරණය(ශ්‍රී ලංකා රජය/ජයිකා ආයතනය) | 63,645,000 | 63,521,959 | 43,200,000 | 41,911,950 | 34.02 |
| 8 | නැගෙනහිර පළාතේ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති කළමනාකරණය(ශ්‍රී ලංකා රජය/ජයිකා ආයතනය) | 53,779,000 | 53,761,809 | 32,890,000 | 32,874,202 | 38.85 |
| 12 | හදිසි ස්වභාවික ආපදා පුනරුත්ථාපන ව්‍යාපෘතිය(ශ්‍රී ලංකා රජය/ජයිකා ආයතනය) | 3,250,000 | 2,685,035 | 5,100,000 | 5,908,281 | -89.88 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 13 | නැගී එන පළාත් ඉලක්ක කරගනිමින් මූලික සමාජ සේවාවන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/ජයිකා ආයතනය) | - | - | 810,000 | - | - |
| 14 | සාධාරණ හා රැකවරණයෙන් පිරි සමාජ සංවර්ධනය සඳහා වන ප්‍රතිපත්ති හා සංවර්ධන වැඩසටහන(යුනිසෙෆ් අරමුදල) | | | 6,650,000 | 6,500,000 | - |
| 15 | ප්‍රජනන සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය ජාතික මට්ටමින් පුළුල් කිරීම ශක්තිමත් කිරීම (එ.ජා.ජ.අ.) | | | 3,000,000 | 2,234,622 | |
| එකතුව | | 178,944,000 | 176,802,748 | 162,737,000 | 157,357,928 | 10.99 |